# ධම්මනියාමතාවය - 5

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

පිට කවරයේ ඇතුල්පැත්ත.

# ධම්මනියාමතාවය - 5

පටිච්චසමුප්පාදය සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය
ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාව.

2021.02.20වැනි දින පවත්වන ලද
සිව්වැනි ධර්ම දේශනාව.

**අවිජ්ජා පච්චයා සංඛාරා නිර්දේශ වර්ණනාව.**

සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන්
විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපය.

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

# ධර්ම දානය පිණිසයි.

**පිටපත් කිරීම සහ සංස්කරණය:**
එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

**තාක්ෂණික දායකත්වය:**
චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු
ධර්මදානයක් වශයෙන් නොමිලයේ
බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම්
දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සදහා
අදාල දේශකයන් වහන්සේගේ අවසරය ලබා
ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්

Skypeතාක්ෂණය ඔස්සේ

අකුරැස්ස, ගල්ලල,

ඉදිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,

පූජ්‍ය ඉලුක්ගේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,

පටිච්චසමුප්පාදය, සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාවේ

2021.02.20වැනි දින පවත්වන ලද

පස්වැනි ධර්ම දේශනාව යි.

## *අවිජ්ජා පච්චයා සංඛාරා නිර්දේශ වර්ණනාව*

අරමුණු කරන ලද
මෙම ධර්ම දේශනාව
ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව
හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි .

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන ආයතන නිරෝධය පිළිබඳව වූ ක්‍රම වේදය

බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

2021.02.20

අවිජ්ජා පච්චයා සංඛාරා (නිර්දේශ වර්ණනාව)

***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස.***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස.***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස.***

තෙරුවන් සරණයි. අදත් අපි කතාකරගත්ත ආකාරයට සූදානම් වෙන්නේ,බුදුරජාණන් වහන්සේ දේශනා කරපු උතුම් දහම් පරියායක් වන පටිච්චසමුප්පාද ධර්මය ආරම්භ කිරීමට යි. අපි මෙතෙක් කතාකරගෙන එමින් පැවැතුනේ පටිච්චසමුප්පාදයේ අංග ඒ ඒ ආකාරයෙන් ප්‍රත්‍යවීම පිළිබඳව යි. එහිදී අපි ඒ ඒ අංගයන් පිළිබඳවත් විස්තර කතාකරමින් ඊට පස්සේ ඒ අංගයන් ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳවත් විග්‍රහකරගනිමිනු යි යන්නේ.

අපි මුලින් කතාකරා මේ පටිච්චසමුප්පාදයේ අංග දොළහක් මූලික වශයෙන් තියෙනවා. ඒ අංග දොළහ වර්තමානයේ ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව බැලුවහම ඒ අංගයන් යම් යම් ආකාරවලින් වෙනස්කම් සිද්ධවෙනවා. නමුත් මේ පටිච්චසමුප්පාදය සූත්‍රාන්ත ක්‍රමයේදී විග්‍රහකරන්නේ, අතීත සසරේ ඉඳන්,සත්ත්වයෙක් පුද්ගලයෙක් සංසාරයේ යම්තාක් සැරිසරනවා නම් ඒ සැරිසරන ආකාරය පිළිබඳව, කෙසේ සසර ගමන්කරන්නේ ද කියන එක පිළිබඳව යි.

ඒ අනුව අපි ඒ ඒ අංගයන් ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව කතා කරා. ***අවිජජා පචචයා සංඛාරා*** කියලා කිව්වහම අපට සූත්‍රවල හම්බවෙන්නේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදින සංස්කාරයන්, පුණ්ඤාභිසංඛාර, අපුණ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර කියලා මේ සංඛාර තුන් වර්ගයක් අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නවා කියලා යි. එතකොට ලෝකයේ

යම්තාක් අතීතයේ මේ වාගේ සංස්කාර, කර්‍ම රැස්වුනා නම්, අනාගතයේ රැස්වෙනවා නම්, වර්‍තමානයේ රැස්වෙනවා නම් ඒ රැස්වෙන්නේ මේ අවිද්‍යා ප්‍රත්‍යයෙන්. එතකොට කුමණ හෝ සංඛාරයක් ඇත්නම් ඒ සියලු සංඛාර නෙවෙයි මෙතැන ගත්තේ. සංස්කාර කොටස්වලට කඩලා ඒ සංඛාර උපදින විදියට යි.

**ඒ නිසා මේ පෙන්නන්නේ මෙය ඇතිකල්හි මෙය වේ කියන ධර්‍ම න්‍යාය ඔස්සේ මිසක් වර්‍තමානයේ කෙනෙකුට පටිච්චසමුප්පාදය උපදින අවස්ථාවක් ගැන නෙවෙයි.**

ඒක අපට වර්‍තමානයට ගලපාගන්න පුළුවන්. නමුත් මේ පෙන්නන්නේ මේ දුක් පටිපාටිය උපදින ආකාරයපිළිබඳව බව ඔබට වටහලා දුන්නා. මොකද ඒක අපි ඔප්පුකරගත්තේ තුන් සංඛාරයක් ගැන අවිද්‍යා ප්‍රත්‍යයෙන් සඳහන් වෙනකොට, වර්‍තමානයේ **කවදාවත් මේ සංඛාර තුන ම එකවර එක සිතක යෙදෙන්න පුළුන්කමක් නැහැ** කියන කාරණාව යි. ඒ නිසා ඒ විදියට අපි එකින් එක ඒ කතාකරගෙන යන්නේ මූලික වැඩ පිළිවෙළේදී ඔන්න ඔය ආකාරයට බව මම නැවත සිහිපත් කරනවා.

ඒ අනුව අපි ගියවර කතාකරේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන මාතෘකාව යි. එහිදී මේ සංස්කාර කියන පදය පිළිබඳව අපි විග්‍රහකරගත්තා. ඒ සංඛාර පිළිබඳව පදයට බුදුරජාණන් වහන්සේ ඒ වචනය උදව්කරගෙන නොයෙක් දහම් පරියායන් විස්තර කරලා තියෙනවා. මේ සංස්කාර, සංඛාර කියන වචනය, මුලු සංඛත ධර්‍මයන්ට ම බුදුරජාණන් වහන්සේ යොදලා තියෙනවා. **ප්‍රත්‍යයෙන් හටගත්ත සියලු ධර්‍මයන්ට සංඛාර කියලා කියනවා. සංඛත සංඛාර කියලා කියන්නේ ඒ අර්ථයෙන්, ප්‍රත්‍යයෙන් හටගත්තු, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක රූප අරූප ආදී සියලු ධර්‍මයන්ට යි.**

ඒ වාගේම තව ඒ විදියට මේ සංස්කාරය පිළිබඳව**ප්‍රයෝගාභිසංඛාර, සංඛත සංඛාර,** ඒ වාගේ ම **අවිජ්ජා පච්චයා සංඛාරා,** කියලා මේ විදියට නොයෙක් ආකාරයේ යෙදෙන බව අපි ගියවර කතා කරා. ඊට පස්සේ අපි ඒක කොටස්කරළා ගත්තා. එයින් මෙතැන කතා කරන්නේ ***සංඛතං අභිසංකරොනතීති සංඛාරා***කියලා යි. සංඛත ධර්මයන් අභිසංස්කරණය (=නැවත නැවත සකස් කරන)කරන අර්ථයෙන් සංඛාර කියලා සඳහන් වන මේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන මේ සංඛාර පිළිබඳව මිසක්, තව කොතෙකුත් සංඛාර තිබ්බත් ඒ සියලු සංඛාර පිළිබඳව නෙවෙයි.අපි ඒ වචනය අරගෙන අර්ථය පැහැදිළි කරගෙන, ඒ සංඛාර මොනවාද කියන එක පිළිබඳවඅපි අපි විග්‍රහකරගත්තා. පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර, කායසංඛාර, වචීසංඛාර, චිත්තසංඛාර කියලා මේ විදියට ඒවා ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව අපි කතාකරා. ඒකට අපි **කච්චානගොත්ත සූත්‍රය**[1]ඉදිරියට අරගෙන ඒ අනුව අපි ඒ සංස්කාරයන් පිළිබඳව විග්‍රහකරගත්තා.

නමුත් පින්වතුනි, මේ සංස්කාර පදය අපේ ජීවිතයට ඉතාමත් වැදගත් දහම් කොට්ඨාශයක්. ඒ නිසා මේක පිළිබඳව අදත් මට කතාකරන්න ඕනේ කියන අදහස ඇතිවුණා. මේක අපි ජීවිතයේ විග්‍රහකරගතයුතු කාරණාවක්. ඒ මොකද, සත්ත්වයා ලෝකයේ සැරිසරණ කොට, අපි සම්මුතියෙන් කිව්වොත්, මේ ස්කන්ධ පටිපාටිය, සත්ත්වයා දුක් විඳිමින් ඇවිදපු කාලය, අතීතය ගත්තොත් පූර්ව කෙළවරක් පෙනෙන්න නැහැ කියලා අපි මතක්කරගත්තා. ඒ මේ අත සැරිසරමින්, සාගර පුරවන්න ලේ කඳුලු වගුරුවමින්,සත්ත්වයා මේ සංසාරයේ සැරිසරපු කාලය ප්‍රමාණයක් කරන්න බැහැ. ඒ සසර සැරිසරණකොට සත්ත්වයෝ සුගතිවල උපදිනවා, දුගතිවල උපදිනවා. මේ විදියට උපදිනවා.

---

[1]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) - 28වැනි පිටුව.

ඇතැම් අවස්ථාවල මේ දුගතියේ ඉපදිච්චි ප්‍රමාණය, දුක් විඳපු වාර ගණන, ප්‍රමාණයක් කරන්න බැහැ කියලාඅපි සඳහන් කරා. ඇතැම් කාලවල අපි සතර අපායට වැටිලා ඒකෙන් ගොඩඑන්න බැරුව, අනාදිමත් කාලයක්, බුද්ධාන්තර ගණනක් දුක් විඳිමින් සසර ඇවිදලා තියෙනවා. මේ ධර්‍මයේ සඳහන්වන කතාවක් තියෙනවා: මම ඒක කෙටියෙන් කියන්නම්. ස්වාමීන් වහන්සේලා පිරිසක් - සමහරවිට මේක ඔබ අහලාත් ඇති. - මහා බෝධිය වඳින්න ගමණක් යනකොට කැලේ මැදින් ගිහිල්ලා අතරමංවෙලා, පාරක් සොයාගන්න බැරුව, මහන්සි නිසා විශාල ගලක් මුල නතරවුනා.පසුව බලනකොට එතැන මහා ගල් පෙරේතයෙක් තමයි ඉඳලා තියෙන්නේ. මේ මහා ගලක් කියලා හිතාගෙන වාඩිවුණාට ඒ ගල සෙලවෙනවා, කෙඳිරිගානවා, දකිනකොට ඒ මහ තෙරුන්වහන්සේ හඳුනාගෙන, ‘අනේ මෙයාගෙන්වත් පාර අහගන්න ඕන‘ කියලා, මේ පෙරේතයාට කතාකරලා,‘මේ අපි සත් දවසක් පුරා අතරමං වුණා. ඔබටවත් අපට පාර කියන්න බැරිද‘ කියලා අහපු වෙලාවේ මේ ප්‍රේතයා කියාපු කතාව ඇහුවාම,‘අනේ අපි මොන දුකකට ද පත්වුනේ. අපි මොන අතරමංවීමක් ද‘ කියන එක වැටහුණා. ‘ස්වාමීනි, ඔබ වහන්සේලා මේ සත් දවසක් කැලේ අතරමං වෙලා ඒකෙන් මිදෙන්න බැරුව කතා කරනවා. ස්වාමීනි, මම මේ ප්‍රේතභාවයට පත්වෙලා මෙතැනින් මිදෙන්න බැරුව, මේ සංසාරයේ දුක් විඳිමින් මේ අතරමං වෙලා දැනට බුද්ධාන්තර හතරක් තිස්සේ මම මෙතැන දුක් විඳිනවා. ඉතින් ඔබ වහන්සේලා මේ දවස් හතක් අතරමංවීම ගැන කතාකරනවා‘.

ඒ වාගේ පින්වතුනි, අපි සමහර පොඩි දේවල්වලට කෙලෙස් ඇතිකරගෙන, කර්‍ම ඇතිකරගෙන, සමහර දේවල් අහිමිවීම ගැන පුදුමාකාර විදියට වද වෙමින් කෙලෙස් ඇතිකරගන්නවා. නමුත් අපි මනුෂ්‍ය විෂය ගැන කල්පනාකරලා බැලුවොත් අපට ඇතිවෙච්චි අහිමිවීම මොකක් ද කියලා හිතෙනවා. මේ සමහරවිට මස් වැදැලි

වාගේ, ඒ වාගේ ම ඇටසැකිලි වාගේ, අවුරුදු ගණනක් වතුර පොදක් නැතුව, වතුර පිපාසයෙන් දුක් විඳිමින් ඉන්නා ප්‍රේත කොටස් ඉන්නවා. ඉතින් මේ අය හිතනවා මෙයාලා මොකක් ද මේ දඟලන්නේ කියලා. මොනවාටද මේ වෙහෙසෙන්නේ කියලා ඒක ඒ තැනත් දැක්කොත් තමයි අපට තේරෙන්නේ. ඒ නිසා මේ සසර පිළිබඳව අනාදිමත් කාලයක් මේ විදියට දුක් විඳිමින් ඇවිද්දේ මේ අප තුළ සකස්වෙන හා සකස්වෙච්චි කර්ම නිසා යි.

ඒ නිසා මේ කර්ම පිළිබඳව මාතෘකාවේ දී මේ කර්ම කියන එක, එක සන්ධිස්ථානයක්. එතකොට මේ පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි කියන මේ සංස්කාරයන් නිසා ම යි ලෝක සත්ත්වයා ඒ මේ අත සැරිසරන්නේ. ඒ සංස්කාරයන් නො තිබුනා නම් ලෝක සත්ත්වයා මේ සසර සැරිසරන්නේ නැහැ කියන එක බුදුරජාණන් වහන්සේ **සංචේතනා සූත්‍රයේ** [2] දී මනාකොට පැහැදිලි කරනවා. ඒක අපි ඉදිරියේ දී ගන්නවා.

ඒ නිසා මේ සංස්කාර කියන පදය පිළිබඳව අපි අවබෝධකරගැනීම, විග්‍රහකරගැනීම, තේරුම්කරගැනීම හා ඒක අපගේ ජීවිතය තුළින් ප්‍රායෝගිකව යොදාගැනීම කියන කාරණා ඉතාමත් වැදගත් වෙනවා. මේ පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි කියන සංස්කාරයන් මොනවා ද කියලා හඳුනාගෙන,ඒවා උපදින නිදානය, හේතුව මොනවාද කියලා තේරුම් ගැනීම ම අපි සම්මාදිට්ඨියට පත්වීමක් හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කරා. ඒකත් පොඩ්ඩක් ඉදිරියට ගත්තොත් හොඳයි කියලා මට හිතුණා.

සැරියුත් මහරහතන් වහන්සේ විසින් දේශනා කරන, මජ්ඣිම නිකායේ තියෙන, **සම්මාදිට්ඨි සූත්‍රය** [3] පිළිබඳව ඔබ අහලා ඇති.ඒ කොටසක් අපි මේ සඳහා එකතුකරගන්න ඕන කියලා

---

2

3 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) – 110වැනි පිටුව.

හිතුණා. **'සම්මා දිට්ඨිය, සම්මා දිට්ඨිය කියලා කියනවා. කෙතෙකින් සම්මාදිට්ඨිය වෙනවාද' කියන කාරණාව ඔස්සේ දහම් පරියායයන් දහසයක් දේශනා කරනවා.**අද මේ අපි කතාකරන <u>**සංඛාර**</u> කියන පදයේතියෙන වැදගත්කම මතුකරගන්න එතැන දී එක කියන දහම් පරියායක් උදව්කරගත්තා.

මෙතැන සැරියුත් මහරහතන්වහන්සේ දේශනා කරනවා, ***යතො ඛො ආවුසො අරියසාවකො අකුසලඤ්ච පජානාති, අකුසලමූලඤ්ච පජානාති. කුසලඤ්ච පජානාති, කුසලමූලඤ්ච පජානාති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතාස්ස දිට්ඨි. ධම්මෙ'ම අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.***- *ඇවැත්නි යම් කලෙක පටන් ආර්‍යශ්‍රාවක තෙමේ අකුසලයත් දනී ද, අකුසලමූලයත් දනී ද, කුසලයත් දනී ද, කුසල මූලයත් දනී ද, ඇවැත්නි මෙපමණකින් ආර්‍යශ්‍රාවක තෙමේ සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වෙයි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. මේ නිර්වාණධර්මයට පැමිණියේ වෙයි.* කියලා සඳහන් වෙනවා. මේක හරියට අවබෝධකරගත්තොත් ඒ වාගේ අර්ථයක් මෙතැන,මේ සංඛාර කියන පදයේ තියෙනවා.

එතැන අපට පෙන්නනවා, ***කතමං පනාවුසො අකුසලං?කතමංඅකුසලමූලං? කතමං කුසලං? කතමං කුසලමූලන්ති?*** -*ඇවැත්නි අකුශලය කවරේ ද? අකුශලමූලය කවරේ ද? කුශලය කවරේ ද? කුශලමූලය කවරේ ද?* කියන මෙන්න මේ කාරණා ටික තමයි අපි දැනගතයුත්තේ, දැකගතයුත්තේ. අපි කර්ම රැස්කරගන්නේඅකුසලය හා අකුසලමූලය නොදන්නාකම නිසා ම යි. එතකොට අපි ඒකේ වැදගත් ටික අපේ ජීවිතයට මතුකරළා ගනිමු.

අකුසලය කියන එක මෙතැන පෙන්නන්නේ:***පාණාතිපාතො ඛො ආවුසො අකුසලං, අදින්නාදානං අකුසලං,***

***කාමෙසුමිච්ඡාචාරො අකුසලං, මුසාවාදො අකුසලං, පිසුණාවාචා අකුසලං, ඵරුසාවාචා අකුසලං, සම්ඵප්පලාපො අකුසලං, අභිජ්ඣා අකුසලං, බ්‍යාපාදො අකුසලං, මිච්ඡාදිට්ඨි අකුසලං. ඉදං වුච්චතාවුසො අකුසලං,***කියලා මේ අකුසල කොතෙකුත් තිබ්බත්, මේ කර්ම පථ වන, මෙතැන අකුසල කියලා ඉදිරියට අරන් තිබ්බේ,මෙතැන ගත්තේ අර ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කොටසේ තියන ධර්ම ටික ම යි.

අකුසල් කිව්වහම බොහෝ අකුසල් තියෙනවා. නමුත් ඒ අකුසල් අතර කෙනෙකුට ප්‍රතිසන්ධිදායක කර්ම සකස්වන, දුක නැවත නැවත උපද්දවන අකුසල කර්ම ටිකක් තියෙනවා. මෙන්න ඒ අකුසල ධර්ම ටික තමයි මේ **දස අකුසල කර්ම පථ**. දැන් මේ අකුසල ධර්ම පථ තමයි අකුසලය කියලා ධර්මයේ සඳහන් වෙන්නේ. <u>ඒවා කයින් වන, වචනයෙන් වන, සිතින් වන අකුසල් කියලා තුන් කොටසකට බෙදෙනවා.</u>

- මුල් කොටස් තුන කයෙන්: පානාතිපාතා, අදින්නාදානා, කාමෙසු මිච්ඡාචාරා.
- අනිත් ටික වචනයෙන්: මුසාවාදා, පිසුනාවාචා, ඵරුසාවාචා, සම්ඵප්ප්‍රලාපා,
- මනොද්වාරයෙන් වන අකුසල තමයි ඊළඟට පෙන්නන්නේ.

මේ ඒ අකුසලයන් ටිකයි:***කතමඤ්චාවුසො අකුසලමූලං? ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං. ඉදං වුච්චතාවුසො අකුසලමූලං.*** අකුසලය උපදින හේතුව **මූලය** කියනවා. මූලය කියලා කියන්නේ ගහකගේ පැවැත්ම, හටගැනීම මුල නිසා සිදුවෙනවා වගේ, මෙතැන මූලය හැටියට සඳහන් වෙන්නේ අකුසලය හටගන්න ප්‍රධාන හේතුව යි. තව බොහෝ හේතු තිබුණත් ප්‍රධාන - මූලය කියන්නේ ඒ අර්ථයෙන් මෙතැන- <u>ප්‍රධාන</u>

භාවයෙන් අකුසලය උපදින්න හේතුවෙන්නේ ලෝභය, ද්වේශය, මෝහය කියන මේ හේතු තුන යි.

එහෙනම් අප තුළ අකුසලයක් ඉපදුනොත් අපි පරීක්ෂා කළයුත්තේ මේ අකුසලය ඉපදුණේ කොහොම ද කියන එක යි. ගවේශනය කරන්න ඕනේ තමන්ගේ ම හිතේ ඉපදිච්චි සන්තානයේ ඉපදිච්චි අකුසලයේ හේතුව පිළිබඳව යි. එතකොට ඒක ලෝභය-ද්වේශය-මෝහය කියලා ධර්මයේ සඳහන්වෙනවා.

පටිච්චසමුප්පාදය ගත්තත්, පටිච්චසමුප්පාදයේ මේ මෙතැන හේතු තුනක් පෙනුනාට, ප්‍රධාන හේතුව වශයෙන් තමයි පටිච්චසමුප්පාදය අරගෙන එන්නේ. එතකොට පටිච්චසමුප්පාදය ගත්තහම අවිද්‍යාව කියන කාරණාව යි. අවිද්‍යාව කියන එක හේතුව යි. සංඛාරය කියන අර තුන් සංඛාරයන් ඒ හේතුවෙන් ඉපදිච්චි ඵලධර්මයෝ හැටියට යි පෙන්නන්නේ. එතකොට ඒ **අවිද්‍යාව නිසා සංඛාර වෙනවා** කියන කාරණාව තමයි මෙතැන පෙන්නන්නේ.

අවිද්‍යාවෙන් තොරව ලෝභය උපදින්න බැහැ. අවිද්‍යාවෙන් තොරව ද්වේෂය උපදින්නත් බැහැ. අන්න ඒ නිසා **මෙතැන ප්‍රධාන ම වෙන්නේ අවිද්‍යාව** යි. එතකොට අපි ඒක පිළිබඳව යි කතා කරන්නේ. අවිද්‍යාව නිසා, අවිද්‍යාව ප්‍රත්‍යවෙන්නේ කොහොම ද කියලා ඒ ප්‍රත්‍ය ශක්තිය පිළිබඳව යි අපි අද කතා කරන්නේ.

**මෙතැන කතා කරන්නේ ප්‍රත්‍යධර්මයන් පිළිබඳව මිසක් ප්‍රත්‍යභාවය පිළිබඳව නෙවෙයි.ප්‍රත්‍යශක්තිය පිළිබඳව නෙවෙයි.**

අද දවසේ දී, ඉදිරියේ දී, ප්‍රත්‍යභාවය, ප්‍රත්‍යශක්තිය පිළිබඳවත් කතාකරන්න බලාපොරොත්තු වෙනවා.

පටිච්චසමුප්පාදයේ පෙන්නන්නේ මේ අකුසල උපදින්න හේතු ධර්මයන් ටික යි. ඇත්තට ම ධර්ම ටික වැදගත්. නමුත් ඒ වාගේ ම මේ ධර්මයන්ගෙන් වන ප්‍රත්‍යාකාරය, ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව වැදගත්. මේ චතුරාර්‍යසත්‍යයේ දී, දුකට හේතුව තණ්හාව යි කියලාඅපි කතා කරනවා. එතකොට ඒ තණ්හාව කියන එක දුකට හේතුවෙන ධර්මයක්. ඒ ධර්මය උපකාරවෙන්නේ දුක උපදවන්නේ මොන ආකාරයෙන් ද, කියන එක පිළිබඳව අපි වෙනම විග්‍රහකරළා පෙන්නනවා.

පටිච්චසමුප්පාදය ගත්තත්, අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං කියලා, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර වෙනවා. සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ වෙනවා කියලා මේ විදියට ප්‍රත්‍යවෙන ධර්මයන් ටික පෙන්නුවාට මේක කොහොම ද ප්‍රත්‍යවෙන්නේ කියන කාරණාව එතැන සඳහන්කරළා නැහැ.

ඒ නිසා මේ අනාත්ම සංසිද්ධිය හොඳාකාරව තේරුම්ගන්න නම් ඒ ප්‍රත්‍ය හා ප්‍රත්‍යභාවය ප්‍රත්‍යශක්තිය පිළිබඳව අපි දැනගතයුතු යි. ඒකත් අපි ඉදිරියේදී කතාකරගනිමු.

සූවිසි ප්‍රත්‍ය ගත්තහම පටිච්චසමුප්පාදයේ,සූවිසි ප්‍රත්‍යයේ අන්න මේ ධර්ම එකක්වත් ඉදිරියට නො ගෙන -ඒවා ධර්ම නැතුව කතාකරන්න බැහැ - සූවිසි ප්‍රත්‍යය, පට්ඨානප්‍රකරණයේ, හේතු ප්‍රත්‍යය, ආරම්මණ ප්‍රත්‍යය, අධිපති ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය, ආදී වශයෙන් අන්න එතැන දී කතාකරන්නේ පැහැදිලිව මේ ප්‍රත්‍ය ශක්තීන් පිළිබඳව යි.

ධර්මය අවිද්‍යාව ප්‍රත්‍යවෙන්න පුළුවන් ආකාර මෙච්චරක් තියෙනවා: ආරම්මණභාවයෙන්, අධිපතිභාවයෙන්, මූලභාවයෙන්, හේතුභාවයෙන් කියලා අන්න ඒ ප්‍රත්‍ය ශක්තිය යි කතා කරන්නේ. එතකොට ඇත්තට මේ සූවිසි ප්‍රත්‍ය කාරණා ටික දැනගැනීමත්, ඉදිරියේ දී මේවා ගවේශණය කර ඉගෙනගැනීමත් හරි වටිනවා. මේ අවිද්‍යාව

මොනආකාරයෙන් ද ප්‍රත්‍යවෙන්නේ, ලෝභය මොන ආකාරයෙන් ද ප්‍රත්‍යවෙන්නේ, කියන ප්‍රත්‍යභාවයන් පිළිබඳව සූවිසි ප්‍රත්‍යයේ දී කතාවෙනවා. අපි ඒ පිළිබඳව ඒ ඒ කොටස් වලදී අපි ඉදිරියට අරගෙන කතාකරමු. ඊට පස්සේ අපි ඒක පිළිබඳව සම්පූර්ණ විස්තරයක් මේ සූවිසි ප්‍රත්‍යය පිළිබඳව කතාකරන්න පුළුවන්.

මෙතැන දී මේ හේතුව පෙන්නුවා. ඵලය පෙන්නුවා. අවිද්‍යාව නිසා මේ අකුසල් ටික මුලින් පෙන්නුවා. ඇත්තට ම මේ අකුසල් තුන, අකුසල මූල තුන, අකුසල ධර්මයෝ උපදින්න හේතුවුනාට,**එකවර මේ තුන ම යෙදෙන්නේ නැහැ**. ඒකත් ඔබ තේරුම්ගතයුතු යි.

මේ කර්මපථ දොළහක් තියෙනවා නම් මේ දොළහම ඇතිවෙන්නේ අවිද්‍යාව හේතුවෙන්. නමුත් මේ අකුසල් ටික සිත් වශයෙන් ගත්තොත්, ලෝභය නිසා වන අකුසල කර්ම පථ, දෝෂය නිසා වන අකුසල කර්ම පථ, මෝහය නිසා ම වන අකුසල කර්ම පථ, ටිකක් මෙතැන තියෙනවා. දැන් උදාහරණයක් වශයෙන් ගත්තහම, ප්‍රාණඝාතය කියන එක අනිවාර්යයෙන් ද්වේශය මුල්වෙලා ම යි සිද්ධවෙන්නේ. ඵරුශවචනය කියන එක ද්වේශය මුල්වෙලා ම යි සිද්ධවෙන්නේ. කේලාම් කියනවා කියන එක ද්වේශය මුල්වෙලා ම යි සිද්ධවෙන්නේ. ඒක ලෝභය මුල්වෙලා සිද්ධවෙන්නේ නැහැ. ඒ නිසා ඒ සිද්ධාන්ත, ඒ හේතු ගත්තහම, අවිද්‍යාව, -මෝහය යි අවිද්‍යාව කියලා කියන්නේ- මෝහය යි, ලෝභය යි මුල්වෙලා අකුසල කර්ම පථ සකස්වෙනවා. මෝහය යි, ද්වේශය යි මුල්වෙලා අකුසල කර්ම පථ සකස්වෙනවා. මෝහය පමණක් තිබිලා අකුසල කර්ම පථ සකස්වෙනවා.

අකුසල කර්මයක් කියලා කියන්නේ,අකුසලයක් කියලා සඳහන්වෙලා තියෙන්නේ ඒ හිතේ යෙදෙන ඒ ධර්ම ටික අනුව යි. නමුත් මේ තුන් ධර්මයන්ට ම අවිද්‍යාව, මෝහය

කියන එක අවශ්‍ය ම යි. ඒ කියන්නේ අරමුණක් තුළ මුලාවුනොත් ම යි මේ පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි සංඛාරයන් සිද්ධවෙන්නේ කියන එක බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. ඒක අපි කොහොමද අවිද්‍යාව නිසා මේ තුන සංඛාරයන් ම වෙන්නේ කියන එක පිළිබඳව අපි ඉදිරියේ දී කතා කරමු.

අපි මෙය තව දුරටත් විග්‍රහකරගනිමු අකුසලය කියන එකේදී. දැන් මෙතැන අපුඤ්ඤාභිසංඛාර කියන කොටස ගත්තහම, සිත් වශයෙන් ගත්තොත් අකුසල් සිත් දොළහක් තියෙනවා. එතකොට ඒක අභිධර්මයේ බැලුවහම හරි ලස්සන යි ඒවා ඉගෙනගත්තහම. දැන් අකුසලකර්ම පථ පිළිබඳව ධර්මයේ අපට සූත්‍රවලින් සඳහන්වෙනවා. නමුත් මේ අකුසලකර්ම පථ සකස්වෙන්නේ මොන මොන සිත්වලින් ද කියන එක පිළිබඳව බොහෝ විට විග්‍රහවෙන්නේ අභිධර්ම පිටකයේ යි. එතකොට ලෝභය මුල්වෙලා, සිත් වශයෙන් ලෝභමූල සිත් අටක් පෙන්නනවා. ද්වේෂය මුල් වෙලා සිත් දෙකක් පෙන්නනවා. මෝහය මුල්වෙලා සිත් දෙකක් පෙන්නනවා. ඒ විදියට සියලු අකුසල ධර්ම දොළහ යි.

එතකොට හැම අකුසලයක් ම සිද්ධවෙන අකුසල සාධාරණ ධර්ම ටිකක් කියලා තියෙනවා. අකුසල චෛතසික දාහතරක් පිළිබඳව සඳහන් වෙනවා. එයින් හැම සිතක ම යෙදෙන අකුසල ධර්ම ටිකක් තියෙනවා. ඒකට කියන්නේ **මෝහ චතුශ්කය** කියලා යි. අකුසල සාධාරන චෛතසික. මෝහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය කියන මේ කෙලෙස් ටික හැම අකුසලයක ම යෙදෙනවා. අකුසලයක් වෙන්න නම් මේ හතර තියෙන්න ම ඕන.

- මෝහය කියලා කියන්නේ අවිද්‍යාව යි.
- අහිරිකය කියන්නේ අකුසලයට ලැජ්ජා නැතිකම යි.

- අනොත්තප්පය කියලා කියන්නේ අකුසලයට භය නැතිකම යි.
- උද්ධච්චය නොසන්සුන්කම කියන එක අකුසලයක තියෙන්න ම ඕන.

මේ ලෝභය අහිරිකය ලෝභය ලැජ්ජා නැතිකම, භය නැතිකම, නොසන්සුන්කම විසිරුණුකම කියන එක හැම අකුසලයක් තුළ ම යෙදෙනවා. ඒ වාගේ ම ද්වේශය, ද්වේශය මුල්වෙලා අකුසලයන් මෙතැන අපට පෙන්නනවා පථ වශයෙන් හතරක්. එතකොට ද්වේශය මුල්වෙලා ප්‍රාණඝාතාදී අකුසලකර්ම සිද්ධවෙනවා. එතකොට ඒ වාගේ මෝහය සමග යෙදෙන දෝෂ චතුෂ්කය කියලා කොටසක් තියෙනවා. **දෝෂ, ඉස්සා, මච්චරි, කුක්කුච්ච** කියලා. ද්වේශය සමග ම යි ඊර්ෂ්‍යාව යෙදෙන්නේ.

- **ද්වේශය** සමග ම යි මච්චරිය යෙදෙන්නේ. ද්වේශය සමගම යි කුක්කුච්චය යෙදෙන්නේ. මේ විදියට ද්වේශය වෙනමත් යෙදෙන්න පුළුවන්.
- **ඊර්ෂ්‍යාව** කියන ධර්මය හිතේ යෙදෙනවා නම් ඒ යෙදෙන්නේ ද්වේශයත් එක්ක ම යි. ඊර්ෂ්‍යාව කියලා කියන්නේ අනුන්ගේ දියුණුවේ දී, අනුන්ගේ අභිවෘද්ධියේ දී, නුරුස්නාබව යි. උහුලන්න බැහැ ඒක. එහෙම සිත් අප තුළ යෙදෙනවා. ඒකත් යෙදෙනකොට ද්වේශය අප තුළ යෙදෙනවා.
- **මසුරුකම**, අනුන්ගේ දේවල් තමන්ට ලබාගන්න ඕනේ කියන අකුසල් සිත් අපට උපදිනවා. එය මච්ඡරිය කියලා කියනවා. මසුරුකම උපදින්නේත් ද්වේශය නිසා ම යි.
- **කුක්කුච්චය** කියලා කියන්නේ කුකුස යි. පසුතැවිල්ල යි. ඉතින් ඒකත් හොඳ නැති ධර්ම ටිකක්. මේවා හරි ම පලිබෝධ යි. අපට වෙච්චි දේවල් පිළිබඳව, කුකුස් ඇති වෙනවා. ඒඅප තුළ ඇතිවන පසුතැවිල්ල යි. ඒ

වාගේ ම නොවෙච්චි දේවල් පිළිබඳව. අපට මේ මේ දේ කරගන්න බැරිවුණා කියලා පසුතැවිල්ල. ඒ පසුතැවිල්ල තුළ තියෙන නිධානය ද්වේශය යි. ද්වේශය යි මෝහය යි මුල්වෙලා තමයි ඒවා සිද්ධවෙන්නේ.

- **ලෝභය** සමග යෙදෙන ධර්ම තියෙනවා. **ලෝභ-දිට්ඨි-මාන.** ලෝභය යි දිට්ඨිය යි මානය යි කියන, **ලෝභ ත්‍රිකය**යි කියලා මේකට සඳහන්වෙනවා. එතකොට දිට්ඨිය යෙදෙනවා නම් ලෝභයත් එක්කම යි යෙදෙන්නේ. මානය කියන අකුසලය යෙදෙනවා නම්, මානය යෙදෙන්නේ ලෝභයත් එක්කම යි. ඒදෙක ලෝභය සමග දිට්ඨිය මානය කියන මේ දේවල් යෙදෙන්න පුළුවන්. එතකොට දිට්ඨිය යි මානයි කියන එක වෙන ම ධර්ම දෙකක්. කවදාවත් ලෝභය සමග දිට්ඨිය, මානය, යෙදුනාට, මානයයි දිට්ඨියයි කවදාවත් එක සිතක උපදින්නේ නැහැ. ඒ හේතුව තමයි, ඒවා වෙනස් අරමුණු ටිකක්. ඒනිසා ඒක පිළිබඳව අපි අවශ්‍යවුණොත් කතාකරමු.

ඒවා ගොඩාක් පටලවාගන්නා අය මේ දිට්ඨිය යි මානය යි පිළිබඳව, එහෙම ගත්තහම, මේ අකුසල ධර්ම ටික යෙදුනහම තමයි මේ කතාකරපු අපි අකුසල ධර්මය, ලෝභය සමග කතා කරපු ධර්ම ටික, මෝහය, අහිරිකය ආදී කතාකරපු අකුසල ධර්ම ටිකක් තියෙනවා. ඊට පස්සේ මෝහය සමග. ඊට පස්සේ ද්වේශය සමග. **දෝස ඉස්සා මච්ඡරිය** ආදී මේ අකුසල ධර්ම ටිකක්.

මේ ධර්ම ටික යම් සිතක යෙදුනහම තමයි ඒකට අපි අකුසල් කියලා කියන්නේ. මොකද, මේ ධර්ම තුළින් තමයි කෙනෙකුට අනිෂ්ඨ වූ, අකාන්ත වූ දුක් විපාක ගෙනැත් දෙන්නේ. අපි ‘කෙනෙක් දුක් විඳිනවා‘, ‘කෙනෙක් අපායට වැටෙනවා‘, කියලා කතා කරාට, එතැන විමසලා බැලුවොත් තියෙන්නේ

අනාත්ම ධර්ම ටිකක්. මේ ද්වේශය සමග යම් ධර්ම ටිකක් යෙදුණොත් ඒකට අපි කියනවා, “පුද්ගලයෙකුට තරහාව ආවා“ කියලා. එතකොට ඒ ද්වේශය සමග ධර්ම ටික යෙදුනහම එයා මුලාවෙනවා. එතැන අවිද්‍යාව යෙදෙනවා. ඊළඟට එතැන සත්ත්ව-පුද්ගලබව යෙදිලා තව තවත් මුලාවට පත්වෙනවා. ඒ හැම එකකට ම මුල්වෙන්නේ මෝහය කියන එක යි. අරමුණ වරදවා ගැනීම කියන දේ නො තිබුණා නම් ලෝභයවත් යෙදෙන්නේ නැහැ. ද්වේශයවත් යෙදෙන්න පුළුවන්කමක් නැහැ.

**ඒ නිසා මේ අවිද්‍යාව කියන කාරණාව සංඛාරය කියන කාරණාව, තේරුම්ගැනීම ඉතාමත් වැදගත්. අපේ ජීවිතයට මේවා සමීප යි.**

එතකොට අකුසල කර්ම පථ ටික අපි කතාකරගත්තා. මේ අකුසල කර්ම පථ නො වෙන්න අනිවාර්යයෙන් බෞද්ධයෙක් වගබලාගත යුතු යි. විශේෂයෙන් නිවන් දකින කෙනා රැකිය යුත්තේ මෙන්න මේ අකුසල කර්ම පථ නො වෙන ආකාරයට යි. ඒ නිසා හැමෝට ම සාධාරණ විදියට අපි ශීලයක් පෙන්නුවා - පඤ්චශීලය කියලා. නමුත් ඇත්තට ම පඤ්චශීලය ප්‍රමාණවත් මදි ගිහිගේ කටයුතු කරන කෙනාට. එයාට ඇත්තට ම **ආජීවඅෂ්ඨමක ශීලයවත් නිත්‍ය ශීලය වශයෙන් සමාදන්වෙලා ඉන්න පුළුවන් වෙන්න ඕන.** ඒක පුළුවන් දෙයක්. ඒකේ විකාලභෝජනය කියන එක නැහැ. ඒකේ ජාත-රූප-රජත කියන මේ ශික්ෂාපදය නැහැ. ඒ නිසා කර්ම පථ බවට සකස්වෙන ශික්ෂා ටික එතැන පෙන්නනවා. ඒ නිසා මේ ඵරුෂවචනය, හිස් වචන කීම, කේලාම් කීම, මෙන්න මේවා ඒකාන්තයෙන් අකුසල කර්ම පථ යි. අන්න ඒ නිසා මේ ටික දැනගෙන, ඒ ටික අනිවාර්යයෙන් සකස් නොවන ආකාරයට, නිවන් දකින්න බණ භාවනා කරන හැම බෞද්ධයෙක් ම සීලය හැටියට සමාදන්වෙලා ජීවත්විය යුතු යි.

ඒ විදියට කෙනෙක් අකුසලය දැනගන්න ඕන. අකුසලය කියන්නේ තමන් තුළ ලෝභය, ප්‍රාණඝාතය කිරීම නමැති අකුසලයක් වෙන්න පුළුවන්. වෙලා තියෙන්න පුළුවන්. එතකොට තමන් තුළ විශේෂයෙන් අපි ඉදිරියට ගත්තොත් නිතර සිද්ධවෙන, බොරු කියනවා කියන එක, අප තුළින් එන්න පුළුවන්. මේක මම මීට පෙරත් කතාකරළා තියෙනවා.

බොරු කියන කොට ඒ ශික්‍ෂාපදය අපි රකින්න වෙනවා. සමහරු ජීවත්වෙනකොට,'මේකනම් රකින්න බැහැ' කියලා අත්හරිනවා. ඒ නිසා නමුත් කැඩෙන එක තමයි අපි විශේෂ අවධානයක් තියෙන්න ඕන. **ඒක රකින කොට අපි බොරු නොකියා ඉන්නවා කියලා නොකියා හිටිය පමණකින් ශීලය රැකෙන්නේ නැහැ.**

සම්මාදිට්ඨියට පත්වෙච්චි කෙනා එතැනින් නෙවෙයි ශීලය රකින්නේ. සම්මාදිට්ඨියෙන් යුක්ත කෙනා බලනවා, බොරුවක් කියන්න මට නිතර නිතර හිතෙනවා නම්, බොරු කිව්වා නම් මේකට හේතුව මොකක් ද? අන්න එතකොට එයාට පෙනෙනවා, තමන්ගේ ම හිතේ ඇතිවුණු යම් ධර්මතාවක් නිසායි මේ අකුසලය සිද්ධවෙන්නේ. බාහිර කාරණාවක් නිසා නෙවෙයි. ද්වේශය මුල්වෙලා සිද්ධවෙනවා නම් මේ බොරුවක් කියවෙනවා නම් මේක බාහිර කාරණයක් නිසා නෙවෙයි, තමන්ගේ සිත නිසා ම යි වෙන්නේ කියලා පරීක්‍ෂා කරනවා. එතකොට එයාට හම්බවෙනවා ලෝභය යි, ද්වේශය යි මුල්වෙලා. ලෝභ සහගත හිත නිසා යි මට මේ බොරු කීම සිද්ධවෙන්නේ. එහෙම නැතිනම් ද්වේශ සහගත හිත නිසා යි මේ අකුසලය මා තුළින් සිද්ධවෙන්නේ. කියලා කල්පනා කරලා බලලා, ඒ ලෝභය ඇති නො වෙන ආකාරයට කටයුතු කරනවා. යම් අරමුණක ලෝභය යෙදුණොත්, ඒකට තියන ආශාව නිසා ඒක බොරුවක් කියලා හරි තමන් අත්පත් කරගන්නවා. ඉතින් ඒක අහිමිවීම ඔහු ඒක වළක්වාගන්නවා බොරුවක් කියලා.

ඒ වාගේ ම තමන් තුළ ද්වේශය යෙදීම නිසා,-ද්වේශය කියන්නේ අන් කෙනාට විපතක් පත් කිරීම යි- බොරුවක් කියලා හරි, බොරු කේලාම් කියලා හරි, ඒ එයාට විපතකට පත්කිරීමට ඔහු ඉදිරිපත්වෙන්නෙත් අන්න ඒ ද්වේශය නමැති ධර්‍මය යෙදුනහම යි.

ද්වේශය යෙදෙන්නේ මොකක් නිසා ද කියලා ඊට පස්සේ බලනකොට එයාට තියෙනවා, මෝහය කියන ධර්‍මය. ඇත්තට ම මෙතැන තියෙන්නේ මෙන්න මෙහෙම ධර්‍ම ටිකක්. මේ අනාත්ම වූ රූපයකට, පඨවි ආදී ධාතු සමූහයකට, කෙස්-ලොම් ආදී අශුභ කොටස් ටිකකට, මම සත්ත්වයෙක්-පුද්ගලයෙක් කියලා ඇතිකරගත්ත මුලාව නිසා නේ ද මේ තරහාව,මේ ලෝභය ඉපදුනේ කියලා අන්න එයා ඇතුළ ගවේශනය කරනවා. ඇතුළට එනවා. ගැඹුරට එනවා. ගැඹුරට ඒම තමයි මෙතැන මේ පටිච්චසමුප්පාද න්‍යායයෙත් පෙන්නන්නේ.

**බුදුරජාණන් වහන්සේ ජාතියෙන් පටන්ගෙන, ජාතියට හේතුව මොකක් ද? භවය යි. භවයට හේතුව මොකක් ද? උපාදානය යි. උපාදානයට හේතුව මොකක් ද? තණ්හාව යි, කියලා ඇතුළට යි ආවේ. එළියට ගියේ නැහැ.**

අන්න ඒ වාගේ මේ සම්මාදිට්ඨියට පත්වෙච්චි ආර්‍යශ්‍රාවකයා ගවේශණය කළ යුත්තේ ඒකයි. අප තුළ නොයෙක් අකුසල් උපදින්න පුළුවන්. ඊර්ෂ්‍යාව, මානය, ආවේ මොකක් නිසා ද කියා සොයාගෙන අපි ඇත්තටම ඒ අකුසලයෙන් මිදෙන්න ඕන. අකුසලයේ ආදීනව අපි දැක්කා. ඒක නිසා අනිවාර්‍යයෙන් ම මේ සංසාරයේ අපට දුක් විඳින්න වෙනවා. එහෙනම් මේක නැතිකරගන්න ඕන. ඒකේ පසුතැවිලා, එහෙම වැළකුණාට, ප්‍රාර්ථනා කරාට මේකෙන් මිදෙන්න බැහැ කියලා දැකලා එයා, එයා මේවා ඇතිවෙච්චි නිදානය හොයනවා. අන්න එතකොට තමයි එයාට අකුසල මූලය කියන එක හම්බවෙන්නේ. එතකොට සම්මාදිට්ඨියට කියන

කාරණාවට පත්වෙන්න නම් ඔහු අකුසලය හා අකුසල මූලය දැනගන්න ඕන.

ඊට පස්සේ ඒකේ දෙවැනි පැත්ත ගත්තහම කුසලය, කුසල මූලය කියන එක දැනගන්නත් ඕන. කෙනෙක් කුසලය දැනගතයුතු යි. කුසල මූලය දැනගත යුතු යි. ඒ කාරණා දෙක නො දන්නවා නම් කෙනෙක් තුළ කුසල ධර්මයෝ තියෙනවා. ඔහු කුසලය හඳුනන්නේ නැති නිසා, පසු කාලයක ඔහුගේ කුසල ධර්මයෝ පිරිහෙන්න පුළුවන්කම තියෙනවා. විනාශවෙලා යන්න පුළුවන්කම තියෙනවා. ඇතැම් අය සතුන් මරන්නේ නැහැ, සොරකම් කරන්නේ නැහැ. බොරු කියන්නේ නැහැ. එයාගේ තුළ මේ කුසල ධර්මයෝ යෙදිලා තියෙනවා.

නමුත් කුසල මූලය දන්නේ නැති නිසා, 'අලෝභ අද්වේශ අමෝහ කියන මේ හේතුව නිසායි මේ ටික මා තුළ පවතින්නේ' කියලා, මූලය නො දන්නාකම නිසා ඔහු පසුකාලයක දී ඒ අකුසලමූලය දුරුවෙලා යන ආකාරයට කටයුතු කරනවා. **අලෝභය තමන්ගේ සිතේ තියෙනවා නම් ඒකේ වැදගත්කම ඒක නොදන්නාකම නිසා පසුව ඔහු මේ ආයතනවලින්, ඉන්ද්‍රියන්වලින් අරමුණු ගන්නකොට ලෝභය ද්වේශය ඇතිවෙන විදියට කටයුතු කරළා පිරිහෙන්න පුළුවන්. අන්න ඒ නිසා තමයි මේ කාරණා අපි දැනගන්න ඕනේ කියලා කියන්නේ.**

එතකොට මෙතැන ***කුසලඤ්ච පජානාති*** කියපු එක,***කතමං පනාවුසො අකුසලං*** කියන එක පෙන්නුවා. පෙන්නලා ඊට පස්සේ කියනවා ***කතමං අකුසල මූලං*** කියලා පෙන්නුවා. ඊට පස්සේ ***කතමං කුසලං*** කියන එක පෙන්නනවා. කුසලය මොකක් ද? ***කතමං කුසල මූලන්ති?***ඒකෙන් වෙන්වීම ම කුසලයක්. ***පාණාතිපාතා වෙරමණී කුසලං, අදින්නාදානා වෙරමණී කුසලං*** කියලා ප්‍රාණඝාතයෙන් වෙන්වීම කුසලයක්, අදින්නාදානයෙන් වෙන්වීම කුසලයක් කියලා අර

අකුසලයන්ගෙන් වෙන්වීම කුසල් හැටියට පෙන්නුවා. තවත් කුසල් තියෙනවා. නමුත් මේ කුසල් ටික ඉතා ප්‍රබල යි. ඉතා බලවත්. මේවා අපට කුසල කම්පථබවට ත් පත්වෙන කුසල්.

එතකොට ඒ කුසලයන්ට හේතුව මොනවා ද? මේ කුසලයන්ගෙන් කෙනෙක් වෙන් වෙනවා නම්, ඒ කියන්නේ හොඳට බලන්න. කෙනෙක් ප්‍රාණඝාතයෙන් වෙන්වීම කියන එක, වෙන්වෙනවා නම් ඔහුට වෙන්වෙන්නේ, අලෝභය කියන එක මුල්වෙලා ම යි. අමෝහය කියන එක මුල්වෙලා ම යි. ඒ නිසා මේ සාසනයේ නොකර හිටිපු පමණකින් ඔහු කුසලවන්තයෙක් සිල්වතෙක් කියලා කියන්නේ නැහැ. මේ කුසල්, අකුසල් නො වෙන තිරිසන් සතුනුත් ඉන්නවා. තිරිසන්සතෙක් ඉන්නවා තණකොළ කාලා ජීවත්වෙන. කුඩා දරුවෙක් ගත්තහම එයාට මේ ප්‍රාණඝාතය හොරකම වෙන්නේ නැහැ. ඉතින් නමුත් එතැනින් කියන්නේ නැහැ ඔහු සිල්වතෙක් කියලා.

ඒ නිසා මේකේ අපට මනාකොට පෙන්නන්නේ කෙනෙක් බොරු කීමෙන් වැළැකිලා ඉන්නවා නම් ඒ වැලැකුණේ කුමක් නිසා ද? අලෝභය නිසා, අද්වේශය නිසා, අමෝහය නිසා ම යි. එතකොට අමෝහය කියන්නේ මොකක් ද, අද්වේශය කියන්නේ මොකක් ද කියලා අපි ඉස්සෙල්ලා ලෝභය ද්වේශය විග්‍රහකරගත්තා වගේ ඇතුළට යන්න ඕන. මේක තේරුම් ගැනීමත් ඉතා වටිනවා. අපි මේ සතුන් මරන්නේ නැතුව, බොරු කියන්නේ නැතුව, කේලාම් කියන්නේ නැතුව හිස්වචන කියන්නේ නැතුව, හිටියා කියලා මේ දේවල් දියුණුවුණේ නැතිනම්, මේවාගේ අවබෝධය දියුණුකරගත්තේ නැතිනම් මේවා කැඩෙන්න පුළුවන් දේවල්. <u>මේවා මෙතැන තියෙන්නේ නූපදිනබවක් නෙවෙයි. මෙතැන යටපත්වෙලා යි තියෙන්නේ.</u>

බොරු නොකියා ඉන්නවා. නමුත් මේ බොරු නොකියා ඉඳීම කියන එක යටපත්වෙලා යි තියෙන්නේ. කොයි වෙලාවේ හරි

බොරු කියන්න පුළුවන්. සමහරවිට අපි මිල මුදල් වෙනුවෙන් බොරු නො කියනවා වෙන්න පුළුවන්. අපේ රක්ෂාව, කීර්ති ප්‍රශංසාව වෙනුවෙන් බොරු නො කියනවා වෙන්න පුළුවන්. අපි ධනය වෙනුවෙන් බොරු නො කියනවා වෙන්න පුළුවන්. නමුත් සමහරවිට අපේ ඥාතියෙක්, දරුවෙක් නිසා බොරු කියන්න පුළුවන්. ඒත් නො කියනවා වෙන්න පුළුවන්. තමන්ගේ අතක් පයක් අහිමිවෙන කොට ඒක බේරාගන්න බොරු කියන්න පුළුවන්. එතනත් නො රැකුණොට තමන්ගේ ජීවිතය රැකගන්න කියලා කෙනෙකුත් බොරු කියන්න පුළුවන්. අන්න ඒ නිසා ඒක පරියන්ත යි. ඒ ඒ දේවල් එනකම් අපිසිල්වන්තයෝ වගේ ඉන්න පුළුවන්. නමුත් ඇතුළත තියෙන මේ අනුශය ක්‍රියාත්මක වෙන කොට ඒකත් අනුශය ක්‍රියාත්මකවෙන්න අරමුණු ලැබෙනකොට මේවා ආයෙ නැගිලා එන්න පුළුවන්.

ඒ නිසා තමයි සම්මාදිට්ඨිය තුලින් මේ ධර්මයෝ බලවත්කරගත යුත්තේ. අලෝභය, අද්වේශය, අමෝහය කියන එක තේරුම් අරගෙන ඒක ඇතිවෙන ආකාරයෙන් කටයුතු කළයුතු යි. ඒකට යි මෙතැන සම්මාදිට්ඨිය යි කියලා කියන්නේ. ඒ විදියට මේ කුසලකර්ම හැටියට පෙන්නලා තියෙන සතුන් මරන එකෙන්, සොරකම් කරන එකෙන් වෙන්වීම යි. වෙන්වුණා නම් වෙන්නේ මහණෙනි, මෙන්න මේ නිධානය නිසා යි. අලෝභය නිසා, අද්වේශය නිසා අමෝහය නිසා යි. ඒ නිසා අපි මේ අකුසලකර්මයන් නොකර ඉන්න නම් අපි කළ යුත්තේ අලෝභය, කියන ධර්මතාවය දියුණුකිරීම යි. අද්වේශය හා අමෝහය කියන ධර්මතාවයන් දියුණු කිරිම යි.

**ඒ විදියට අකුසලය, අකුසල මූලය, කුසල මූලය, දැනගැනීම ම ඔහු සම්මාදිට්ඨියට පත්වුණා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා.**

ඊට පස්සේ සැරියුත් මහරහතන් වහන්සේ අන්තිමේට පෙන්නනවා ***යථො ඛො ආවුසො අරියසාවකො එවං අකුසලං පජානාති. එවං අකුසලමූලං පජානාති. එවං කුසලං පජානාති. එවං කුසලමූලං පජානාති. සො සබබසොරාගානුසයං පහාය පඨිඝානුසයං පටිවිනොදෙත්වා අසමීති දිටඨිමානානුසයං සමූහනිත්වා අවිජජං පහාය විජජං උපපාදෙතවා දිට්ඨෙව ධම්මෙ දුකකසසනතං කරො හොති එතතාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිටඨී හොති; උජුගතාසස දිට්ඨී, ධමෙ'ම අවෙචචපපසාදෙන සමනනාගතො ආගතො ඉමං සදධමමනති***කියලා මේ විදියට පෙන්නලා (කාලය යන හින්දා මේක සිංහලයෙන් විතරක් කියනවා.)**ඇවැත්නි, යම් කලෙක පටන් ආර්යශ්‍රාවක තෙමේ මෙසේ අකුශලය දනී ද, මෙසේ අකුශලමූලය දනී ද, මෙසේ කුශලය දනී ද, මෙසේ කුශලමූලය දනී ද, හෙතෙමේ සර්වප්‍රකාරයෙන් රාගානුශය නැතිකොට, ප්‍රතිඝානුශය දුරු කොට අස්මි (‘මම‘ය යන) දෘෂ්ටිය බඳු වූ මානානුසය නසා, අවිද්‍යාව හැර විද්‍යාව උපදවා ඉහාත්මයේ දී ම දුක් කෙළවර කරන්නෙක් වෙයි. ඇවැත්නි. මෙතෙකිනුදු ආර්යශ්‍රාවක තෙමේ** විද්‍යාව උපදවාරාගය ද්වේශය මෝහය නැතිකරන්නේ කොහොම ද ඔහු විද්‍යාව සම්මාදිට්ඨිය උපදවාගෙන මේ සියලු අකුසල ධර්‍මයන් දුරුකරගන්නේ වෙයි.ඇවැත්නි මෙතෙකින් ම ආර්යශ්‍රාවක තෙමේ**සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ දෘෂ්ඨිය ඍජු වෙයි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ මේ නිර්වාණධර්මයට පැමිණියේ වෙයි.**

බලන්න, මේක වැදගත්. මේක මේ අපි කතාකරන මේ සන්ධිස්ථානය තමයි මේ. අවිජ්ජා පච්චයා සංඛාරා කියන කාරණාව. ඒ සංඛාරයන් තුළ තියෙන කුසලය දැනගැනීම, කුසල මූලය, අකුසලය අකුසල මූලය ඒ කියන කාරණා තමයි අපි කතාකරගෙන ආවේ.

එතකොට ඒ විදියට ඒ **සම්මාදිට්ඨිසූත්‍රය**[4] ඇසුරෙන් අපි මේක ඉතාමත් වැදගත් සන්ධිස්ථානයක් නිසා තමයි අපි මෙතැන කතාකරන්නේ. මේ කර්ම සකස්වෙන තැන යි. ඒ නිසා මේක මේ ආකාරයෙන් අපි හොඳට තේරුවා. කුසලය කියන එකත් ඔබ තේරුම්ගන්න: මේ සාසනයේ කුසල් කියන එක තියෙනවා. අපි ගිය සැරේ කතා කරා කාමාවචර, රූපාවචර, අරූපාවචර කුසල් අකුසල් බෙදනවා. එතකොට එයින් පුඤ්ඤාභිසඞ්ඛාරයට ගත්තේ අපි මේ කුසල් කියන දේවල්. කාමාවචර කුසල් සිත් අටක් තියෙනවා. ඒ අට යි, රූපාවචර කුසල් සිත් පහක් තියෙනවා. එතකොට ඒ දහතුණක් තියෙනවා. ඒ දහතුන තමයි කුසල සංඛාර. අරූපාවචර කුසල සංඛාර හතරක් තියෙනවා. ඒක ආනෙඤ්ජාභිසංඛාර හැටියට. මේ හැම කුසලයක් ම අලෝභය, අද්වේශය, අමෝහය, මුල්වෙලා ම යි සිද්ධවෙන්නේ කියලා කතා කළා. නමුත් ඒකට අවිද්‍යාව ප්‍රත්‍යවෙන්නේ මොන ආකාරයෙන් ද කියන එක පිළිබඳව දැනගන්න ඔබට කුතුහලයක් ඇති. ඉදිරියේ දී ඒක අපි කතා කරමු.

මේ විදියට මේ සන්ධිය අපට ගලවාගන්න පුළුවන් තැනක්. මේ සසර බැම්ම ගලවාගන්න පුළුවන් සන්ධි තුනක් පිළිබඳව, අවස්ථා තුණක් පිළිබඳව සඳහන්. මේ පටිච්චසමුප්පාදය ගත්තහම ඒ පටිච්චසමුප්පාදය ඇතුළතට ගියහම මේ වාගේ විග්‍රහකරගතයුතු කාරණා රාශියක් තියෙනවා. මේ සංඛාර ඇතිවෙන එක නවත්වාගත්තොත්, විපාක, ප්‍රතිසන්ධි විපාක නවත්වාගන්න පුළුවන්. ඒ නිසා **අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන සංඛාර කියන ඒවා සකස්වෙන තාක් කල් අපට ප්‍රතිසන්ධි විඤ්ඤාණය, එහෙම නැතිනම් දුක උපද්දවනවා කියන එක නතරවෙන්නේ නැහැ.** ඒ නිසා අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන සංඛාර නතරකරගත්තොත්, මත්තෙහි විඤ්ඤාණ-නාමරූප-සළායතන ආදී මේ විපාක ටික උපදින එක ජාති-ජරා-මරණ ආදී විපාක උපදින එක නවත්තාගන්න පුළුවන්.

[4]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) – 110වැනි පිටුව

පටිච්චසමුප්පාදයේ එතැන මතුවෙච්චි නිසා ඒකත් අපි මෙතැන දී ගනිමු. [5]

**සන්ධිත්‍රය මේ සටහනින් බලාගත යුතු.**

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා
සඞ්ඛාරපච්චයා
හේතු ඵල සන්ධිය ---------------------------------- 0
විඤ්ඤාණං
විඤ්ඤාණපච්චයා නාමරූපං
නාමරූපපච්චයා සළායතනං
සළායතනපච්චයා පස්සෝ
ඵස්සපච්චයා වේදනා
වේදනා පච්චයා
ඵල හේතු සන්ධිය -------------------------------------0
තණ්හා
තණ්හාපච්චයා උපාදානං
උපාදානපච්චයා භවො
භවපච්චයා
හේතු ඵල සන්ධිය -------------------------------0
ජාති
ජාතිපච්චයා ජරාමරණං සෝක
පරිදේවදුක්ඛදෝමනස්සුපායාසා
සම්භවන්ති.

මෙතැන සන්ධි තුණක් පිළිබඳව සඳහන් වෙනවා. හේතු-ඵල සන්ධිය, ඵල-හේතු සන්ධිය, හේතු-ඵල සන්ධිය කියලා. හේතු ටිකක් නිසා ඵල උපදින අවස්ථාව, ඵල ධර්ම නිසා නැවත

[5]පටිච්චසමුප්පාද විවරණය, රේරුකානේ චන්දවිමල මහා ස්ථවිර (97-98 පිටු)

හේතු සකස්වෙන ආකාරය,හා, නැවත හේතු නිසා ඵල සකස්වෙන ආකාරය.

මේක අර්ථ වශයෙන් ගත්තොත් අතීත-වර්තමාණ අර්ථයක් තියෙනවා. කොටසක් තියෙනවා. වර්මාණයේ ම හේතු-ඵල යෙදෙන කොටසක් තියෙනවා. අතීත හේතු නිසා වර්තමාණ ඵල හේතුවෙන ආකාරයක් තියෙනවා. ඒ වාගේ ම වර්තමාණ හේතු නිසා අනාගතයේ ඵල උපදින ආකාරයක් පිළිබඳව සඳහන්වෙනවා. අපි ඒක විග්‍රහ කරගනිමු.

හේතු හැටියට අවිද්‍යා සංඛාර කියන මෙන්න මේ ටික හේතු වෙලා, ඵල උපදිනවා. ඵල සන්ධියේ දී විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා කියන මේ කොටස් ටික යි. මේවා කෙලෙස් නෙවෙයි. මේ විපාක ටික යි. උඩින් තියෙන්නේ කර්‍ම ටික යි. කෙලෙස් ටික යි. එතකොට ඒ කර්‍ම නිසා විපාක යි. ඊට පස්සේ මේ විඤ්ඤාණ-නාමරූප ආදී මේ විපාක ටික තියෙනවා. එතකොට ඒ විපාක නිසා, දැන් අපට රූපයක් පෙනෙන බව විපාකයක්, ශබ්දයක් ඇහෙනබව විපාකයක්, ඒක කාටත් වෙන එකක්. රහතන් වහන්සේටත් රූප පෙනෙනවා. සද්දත් ඇහෙනවා.

හැබැයි රූපයක් දකිනකොට ශබ්දයක් ඇහෙනකොට එතැන අවිද්‍යාව යෙදිලා, ඒවා නැවත ඒ රූප, ශබ්ද කෙරෙහි තණ්හා, උපාදාන, භව ආදී නැවත කෙලෙස් ඇතිවෙනවා අවිද්‍යාව සංඛාර නිසා.

ඒ නිසා වර්තමාණයේ ඵල කර්‍ම නිසා මේ ඵල ටික හටගන්නවා. ඵල කියන කොට අපි තේරෙන විදියට ගත්තොත් දකිනවා, අහනවා, රස විඳිනවා, කයට ස්පර්ශයන් ලැබෙනවා කියන මෙන්න මේවා යි. ඒ තුළ තියෙන්නේ මෙන්න මේ ටික යි. විඤ්ඤාණය, නාමරූපය, ආයතන ටික, ස්පර්ශය, වේදනාව කියන ඔය ටික විපාක යි.

ඔය ටික විපාක ටිකක් මිස ඕකෙන්ප්‍රතිසන්ධි දෙන්නේනැහැ. අනාගතයේ ප්‍රතිසන්ධි දෙන්නේ මේ විපාක අරභයා අපි නැවැත අවිද්‍යාවට පත්වෙලා, තණ්හා උපාදාන භව ඇතිකරගන්නවා. අන්න ඒ ටික තමයි ඵල-හේතු සන්ධිය හැටියට පෙන්නන්නේ. මේ විපාක ටිකට අපි හේතු සකස්කරගන්නවා අවිද්‍යාව නිසා. ඒ හේතු නිසා නැවැත අනාගතයේ අපි ජාති-ජරා-මරණ-සෝක-පරිදේව-දුක්-දොම්නස් කියලා මේ ජීවිතයේ දී ත්, අනාගතයේ දී ත්, නැවැත අපට ඵල ටිකක් උපදිනවා. එතකොට මේකට කියනවා සන්ධිය. මෙන්න මේක අපට වැදගත් වෙනවා අපට මෙතැනින් අපට මේ අවිද්‍යා, සංඛාර කියන කාරණාවෙන් අපට මේක විසඳාගන්න පුළුවන්, තේරුම්ගන්න පුළුවන්බවක් තියෙනවා.

එතකොට මෙන්න මෙතැන අපි ගත්තොත් මේ පටිච්චසමුප්පාදය - රේරුකාණේ ස්වාමීන් වහන්සේගේ පොතෙන් [6] ගත්තේ මම. මේ පටිච්චසමුප්පාදය අපට තේරුම්ගැනීමේ පහසුව සඳහා මේ කොටස්වලට කඩලා තියෙන ආකාරය තමයි.




[6] පටිච්චසමුප්පාද විවරණය, රේරුකානේ චන්දවිමල මහා ස්ථවිර (103 පිටුව)

එතකොට පටිච්චසමුප්පාදය අපි චක්‍රයක් කියලා කිව්වා. මේක චක්‍රයක්. මේ චක්‍රය ඇතුලේ අංග දොළහක් තියෙනවා කියලා අපි කතාකළා. අවිද්‍යා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප. (මේවා පිළිබඳව ඔබ කුකුස් කරන්න එපා. ඔබ තේරුම්ගන්න, මේවා සූත්‍ර පිටකයේ මෙහෙම බෙදලා කොටස් කරලා, ඔබට දකින්න නො ලැබෙන්න පුළුවන්. නමුත් ඒ ධර්ම අනුසාරයෙන් කරන විග්‍රහය ඒකට ගැලැපෙනවා. ඒකට විරුද්ධ නැහැ. ඉතින් ඒ නිසා යමක් තේරුම්ගන්න යම් යම් විග්‍රහයන් අට්ඨකතාචාරීන් වහන්සේලා අතරත්, රහතන් වහන්සේලා අතරත්, හැබැයි ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉදිරියෙන් තියාගෙන තමයි ඒවා කරේ. ඒ වාගේ සිද්ධියක් තමයි මෙතැන.)

පටිච්චසමුප්පාදය සිද්ධියේ ම කොටස් තුනකට බෙදන්න පුළුවන්. කෙලෙස්, කර්ම, විපාක කියලා. කෙලෙස් ටික, කර්ම ටික, විපාක ටික කියලා. එතකොට මෙතැන කෙලෙස්, මෙතැන කර්ම, මෙතැන විපාක ටික යි. (චක්‍රය පෙන්වමින්)

එතකොට කෙලෙස් කියලා කිව්වේ මොනවා ද? අවිද්‍යා, තණ්හා, උපාදාන. කෙලෙස් ටික යි. මේ තියෙන්නේ කෙලෙස් ටිකයි. උඩ ටිකයි.

කර්ම ටික මොකක් ද? සංඛාර හා භවය. කියලා. මෙතැන කර්ම භවය කියලා අරන් තියෙන්නේ. භවය, උත්පත්ති භවය හා කර්ම භවය කියලාකොටස් දෙකකට බෙදනවා.එතකොට ඒ කර්ම භවය යි සංඛාරය යි තමයි කර්ම ටික වෙන්නේ. මේ ටිකෙන් තමයි උපතක් සකස් කරන්නේ.

විපාක හැටියට පෙන්නනවා මේ විපාක ටික, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා කියන මේ විපාක ටික.

එතකොට **කෙලෙස් වට්ටය, කර්ම වට්ටය, විපාක වට්ටය** කියලා මේ පටිච්චසමුප්පාදයේ කොටස් ටික අපට කඩාගන්න

පුළුවන්. ඒ කඩාගත්තයින් පස්සේ, මේ කර්ම සකස්වෙන තැනින් අපට, අපේ මේ සම්මාදිට්ඨිය ඇතිකරගෙන සසර ගමන ගලවාගන්න පුළුවන්. ඊට පස්සේ අර වට්ට තුණක් කලා කළා.

ඊට පස්සේ වේදනාව කියන තැනින් අපට සසර ගලවාගන්න පුළුවන්. වෙදනා පච්චයා තණ්හා කියන තැනින්. මොකද, වේදනාව කියන දේවල් පොදු ධර්මතාවයන්. හැම සිතක ම යෙදෙන්න පුළුවන්. නමුත් වේදනාව නිසා තණ්හාව ඇතිවෙනවා කියන එක අපි අවිද්‍යාව නිසා ඇතිවෙන එකක්. ඒ නිසා එතැනිනුත් කෙනෙකුට වේදනාව පිරිසිඳ දැකලා, වේදනාවට තණ්හාව ඇතිනොවෙන්න කටයුතු කරගත්තොත්, එයාට එතැනින් මිදෙන්න පුළුවන්.

ඊළඟට පටිච්චසමුප්පාදයේ තියෙන්නේ භවය කියන තැන යි. භව පච්චයා ජාති. භවය කියලා කියන්නේත් කර්මයට ම තමයි. මුලින් අපි කතා කරපු සංඛාර කියන තැනත් තියෙන්නේ කර්ම ටිකක්. ඊට පස්සේ හම්බවෙච්ච උපාදාන පච්චයා භව කියන තැන තියෙන්නේ ත් කර්ම ටිකක්. අපි ඒක ඒ කතාවේ දී එතැනදිත් කතා කරනවා.

එතකොට භවය කියන කර්මභවය කර්ම සකස් නො වෙන විදියට අපි කටයුතු කිරීමෙන් ඒ කර්මභවය නවත්වාගන්න පුළුවන්. අන්න ඒක අපි කතාකරා. මේ කර්මය කියන කාරණාව ගත්තහම ඒකත් ඉතාමත් වැදගත්. මෙතැන දී යම් ප්‍රමාණයක් මම කතා කරනවා. නමුත් කර්මභවය කියන තැනට, භවය කියන මාතෘකාව යටතේ ඒක අපි විස්තර කරගනිමු.

මොකද මම එහෙම කියන්න හේතුව, මේ කර්මය කියන එක නැතිකරන්න පුළුවන් එකක්. (මේක නුවණින් තේරුම්ගන්න ඕන කාරණාවක්.) අපි ගාව මේ අදහසක් තියෙනවා,'කර්ම කරා නම් අපි අනිවාර්යයෙන් විපාක විඳින්න වෙනවා'කියලා.

ඒකේ ඇත්තක් නැතුවා නෙවෙයි. නමුත් කර්ම ගෙවන්න බැරි නම්, අපට මේ කර්ම ටික ගෙවලාම නම්, එහෙම නැතිනම් කර්මවලට විපාක දීලා ම නම් අපට නිවන් දකින්න වෙන්නේ, කවදාවත් අපට සසරෙන් ගැලැවෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපට සකස්වෙච්චි කර්මවල ප්‍රමාණය කොච්චරක් ද කියලා කියන්න අපි දන්නේ නැහැ.

ඒ වාගේ ම දැන් මේ මේ වර්තමාණයේ සකස්වෙන කර්මවල ප්‍රමාණයත් අපට කියන්න බැහැ. රෑ දවල් දෙකේ සතිය නැති, සිහිය ප්‍රඥාව නැති, හැම මොහොතේ ම අප තුළ කර්ම සකස්වෙනවා. මෙහෙම ගත්තහම මේවා ගෙවලා ඉවරකරන්න කිව්වොත් ඉවරකරන්න බැහැ.

ඒ නිසා මේ කර්මය කියන එක පවතින්නේ කර්මයට විපාකය ඉබේ හටගන්නේ නැහැ. ඒකටත් ප්‍රත්‍යයක්, හේතුවක් තියෙනවා. කර්මයක් විපාක දෙන්නේ ඒකට සුදුසු පරිසරය සකස්වුණහම යි. ඉතින් ඒ නිසා උපන්න ජීවිතයේ ඒ අවස්ථාව ආවහම,පෙර කරපු කර්ම ටික අපට යම් ආකාරයකින් විපාක දෙන්න පුළුවන්. ඒ අවස්ථාව වලක්වාගත්තොත් ඒකෙන් විපාක වලක්වාගන්නත් පුළුවන්කම තියෙනවා. හැබැයි ඒක අපට කියන්න බැහැ.

බුදු පසේබුදු මහරහතන්වහන්සේලා ට ත් කර්ම විපාක පිළිබඳව මේ සිද්ධියට මුහුණදෙන්න වුණා. බුදුරජාණන් වහන්සේට ත් කර්ම විපාක දීලා තියෙනවා. ඒ වාගේම රහතන්වහන්සේලාට ත් මේ කර්ම විපාක සකස්වෙලා තිබුණා. එතකොට ඒ කර්ම විපාක දැන් බුදුරජාණන් වහන්සේලාටත් එහෙනම් කර්ම තියෙනවා ද කියලා ඇහුවොත් ඒකෙයි අපි තේරුම්ගන්න ඕන. කර්මයේ කොටස් දෙකක් තියෙනවා.

- එකක් තමයි, ප්‍රතිසන්ධිදායක ශක්තියක් කර්මය තුළ තියෙනවා.

○ ඊට පස්සේ ප්‍රවෘත්ති විපාක දෙන්න පුළුවන් ශක්තියක් කර්මය තුළ තියෙනවා.

සොවන්, සකදාගාමී මේ විදියට අර්හත්ඵලයට යන කොට අපි කරපු සියලු කර්මයන්ගේ ප්‍රතිසන්ධි දෙන්න පුළුවන් ශක්තිය නැතිවෙලා යනවා. ඒක සහමුලින් ම විනාශවෙලා යනවා. හැබැයි ඒඋපන්න ජීවිතය රහත්වෙලා ඉන්න ඒ ජීවිතයේඉන්න තාක් කල් ප්‍රවෘත්ති විපාක දෙන්න පෙර කර්ම සුදුසු අවස්ථාව ඉදිරිපත්වුණොත් ඒක ඒ ජීවිතය තුළ විපාක දෙන්න පුළුවන්. ඒ නිසා ඒ විදියට අපි කර්මය දැනගන්න ඕන.

නමුත් අපට මේ කර්මය කියන එක නිත්‍යභාවයක් ඇතිවෙලා තියෙනවා. අපි ඒක තේරුම්ගන්න ඕනේ. මේක වැරැද්දට යන්නත් හේතු වෙනවා. ඒ නිසා නුවණින් මේක තේරුම්ගන්න ඕනේ කාරණාවක්. මේ ශාසනයේ පෙන්නනවා කර්මක්ෂය කරන්න පුළුවන් කියලා. <u>කර්මක්ෂය කරන්න පුළුවන් මේ ශාසනයේ ම පමණ යි. ඒ හේතුව තමයි, කර්මයක ප්‍රතිසන්ධි දෙන්නේ අවිද්‍යාව තිබුණොත් පමණම යි.</u> දැන් කර්මය කියලා කියන්නේ චේතනාවයි. ඒක යෙදෙන්නේත් හිතේ යි. අපි මේ කර්මය තැන්පත්වෙනවා, තැන්පත් වෙනවා කියන කාරණාව අපි ඕලාරිකව තේරුම් අරන් තියෙන විදිය වැරැදි යි. සමහර අය විද්‍යාව අනුව - දවසක් මේ මහත්මයෙක් මට කතා කරළා කිව්වා මොළයේ මේ පැත්තක මේවා තැන්පත් වෙනවා කියලා. ඒ අවස්ථාව ආවාම ඒවා මොළයෙන් ක්‍රියාත්මක වෙලා අප තුළ ක්‍රියාකාරකම් වෙනවා කියලා. එහෙම කවදාවත්වෙන්නේ නැහැ. ඒවා නො දන්නාකම නිසා කියන කතාවල්.

නමුත් මේ ධර්මතාවයන් කියන දේවල් ගත්තහම කෝකටත් එකයි. කර්මය නියෝජනය කරන්නේ චේතනා චෛතසිකය නම් චේතනාව කොහේ හරි තැන්පත්වෙලා තියෙනවා කිව්වොත් වැරැදි යි. අපි බොරුවක් කිව්වොත් ඒ බොරුව කීම

සඳහා යම් රූපයක්, නාම ධර්මිකක් අපි කිව්වොත් රූප-වේදනා-සංඥා-සංඛාර-විඥාන කියන මේ ධර්මතා පහක් උදව්වෙලා බොරු කීම නමැති සිද්ධාන්තය වුණා නම්, ඒ බොරු කීමට හේතුවෙච්චි රූපයත් ඒ වචන ටිකත්, ඒ ශබ්ද ටිකත්, එතැන හටගත්තු නාමධර්ම ටිකත් සියල්ල ම එතැන ම නිරුද්ධවෙලා. නමුත් ඒ නිරුද්ධවුනාට චේතනාව තුළ සත්‍යාසත්‍ය සකස්වෙනවා. එතැන බලවත් ලෙස ඒ හිත සකස්වුණානම් අනාගතයේ විපාක දෙන්න පුළුවන් ශක්තියක් ඇතිවෙනවා. ඒ ශක්තිය කොහේද තියෙන්නේ කියලා අපට කොහේ හරි තැන්පත්වෙලා තියෙනවා නෙවෙයි. ඒ ශක්තිය ක්‍රියාත්මක වෙන්නේ ඊට සුදුසු පරිසරය සකස්වුණහම එතැන මුළාවට පත්වුණහම අන්න අරක ඉදිරිපත් වෙනවා. ඉතින් ඒ නිසා <u>අපි කරපු කියපු දේවල් නිත්‍ය යි ආත්ම යි කියලා ගන්න තාක් කල් අපට පෙර දේවල් සිහිවෙවී විපාක දෙන්න පුළුවන්කම තියෙනවා.</u> මම මේ කියන්නේ ප්‍රවෘත්ති විපාක ගැන නෙවෙයි. ප්‍රතිසන්ධි විපාක පිළිබඳව යි මේ කතා කරන්නේ. එතකොට කෙනෙකුට යම් දවසක ධර්මය තේරුම් අරගෙන මේ ස්කන්ධයන් චිත්ත චෛතසිකයන්ගේ ධර්මතාවය තේරුම් අරගෙන ඔහු අවබෝධ කරගත්තොත් අතීතයේ යම්තාක් විපාක, කර්ම, කෙලෙස් කියලා යම් කොටස් ටිකක් තිබුණා නම් ඒ වාගේ ධර්මතාවයක් හටගත්ත සැනින් බිඳිලා යනවා කියන එක තේරුම්ගත්තොත් "අතීතයේ යමක් තිබ්බා නම් ඒ සියල්ල ම නිරෝධ යි. හැබැයි ඒවා ඇතිබවට මට එන්නේ, මගේ ම අවිද්‍යාව නිසා මිසක් ඒ දේවල් තියෙන නිසා නෙවෙයි" කියන කාරණාව තේරුම්ගත්තු කෙනාට එයාට ඒ අතීත ධර්මයෝ හටගෙන ආපසු තණ්හා-උපාදාන ඇතිවෙන්න හෝ ඒවා නිසා ප්‍රතිසන්ධි විපාක දෙන්න හෝ පුළුවන්කමක් නැහැ. අන්න මේ කාරණාව තේරුම්ගන්න, තේරුම්ගන්න තමයි කර්මය ගෙවෙනවා කියලා කියන්නේ. අපි දැන්, සමහරවිට අපි කරපු සිද්ධියක් පිළිබඳව ඇඩිව අරගෙන ඒවා නැවත නැවත සිහි කර කර ඉන්නවා. මේ අවිද්‍යාව නිසා යි. කෙනෙක් මේක සම්මාදිට්ඨියට පත්වෙලා,මේ

සිහිවෙන ගතිය ගෙවාගත්තොත්, ඒකේ ආදීනව දැකලා, මේ තමන්ගේ මනසෙන් ම ඇතිබවට අරගෙන නේ ද සිහිවෙන්නේ කියලා නැවත නැවත සිහි කර කර මේ ගතිය ගෙවලා දැම්මොත් අන්න කර්ම ශක්තිය තමයි දුර්වලවෙන්නේ. කර්ම ශක්තිය දුර්වල වෙනවා. ඒ විදියට තමයි ගෙව්ලා යන්නේ.

ඒ විදියට මේ කර්ම කියන, මේ **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන කොටස හොඳට මතුකරගෙන මේ අකුසල සංඛාර කුසල සංඛාර කියන මේ දේවල් සකස්වෙන්නේ කොහොම ද, මේවා නැතිකරගන්නේ කොහොම ද කියන එක පිළිබඳව අපි හොඳාකාරව තේරුම්ගන්න ඕන. ඒ නිසා මේ මාතෘකාව පිළිබඳව තව ටිකක් විස්තර කතා කරේ මේ නිසා යි. තවත් අපට ඉදිරියට තවත් වැදගත් දේවල් තිබුණොත් ඉදිරියට අරගෙන අපි කතාකරමු.

ඊළඟට අපට කතාකරගන්න තියෙන්නේ පටිච්චසමුප්පාදයේ අර්ථ විග්‍රහයන් ටික අපට කතාකරගන්න තියෙනවා. ආපසු පටිච්චසමුප්පාදයේ **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන කොටසට අපි යමු. **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන එක ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව දැන් අපි කතාකරගන්න ඕන. ඒකේ ඉතුරු කොටසක් තිබුණොත් අපි ඉදිරියේ දී කතා කරමු. මේ ටිකත් වැදගත් නිසා.

දැන් අපි ඉස්සෙල්ලා කිව්වා **ප්‍රත්‍යවීම** පිළිබඳව. මේ ප්‍රත්‍යවීම ටිකක් ආපහු විග්‍රහකරගතයුතු කාරණාවක්. **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන මේ ධර්ම දෙක ගත්තහම <u>අවිද්‍යාව කිව්වේ මෝහය නමැති ධර්මය</u> යි. <u>සංඛාරය යි කියලා කිව්වේ චේතනා චෛතසිකය</u> යි. අවිද්‍යාවගේ නානත්වය මත තමයි චේතනාවගේ නානත්වයක් එන්නේ. එතකොට ඒ චේතනාව තමයි බෙදුවේ පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි-කුසල්-අකුසල් හා ආනෙඤ්ජාභි සංඛාර කියලා බෙදුවේ ඒ චේතනාවේ නානත්‍වය පදනම්කරගෙන යි.

ඒ අවිජ්ජාව කියන කාරණාව සංඛාරය ඇති කරන්න ප්‍රත්‍යවෙන්නේ කොහොම ද කියන එක පිළිබඳව මේ ධර්මයේ සඳහන්වුණා. ඒක අපි මේ වෙලාවේ කතාකරමු. ප්‍රත්‍යවීම කියන එක පිළිබඳව අපි මුලින් ම දේශනාවේ කරා. මේ ප්‍රත්‍ය කියන එකට අවිද්‍යාව නිසා සංඛාර ඇතිවෙනවා කියලා කිව්වාට සංඛාර ඇතිවෙන්න එක ම හේතුව අවිද්‍යාව පමණක් නෙවෙයි. තව නොයෙක් හේතු තියෙන්න පුළුවන්. නමුත් එතැන ප්‍රධානභාවයෙන් තමයිඅරන් තියෙන්නේ. බුදුරජාණන් වහන්සේගේ දේශනාවන් හරි විචිත්‍රයි. ඒවා යේ යම් යම් ඒ සිද්ධාන්ත අනුව ගන්නවා. අපි ඉදිරියේ දී ඇයි එහෙම ගත්තේ කියන එක පිළිබඳවත් කතා කරමු.

එතකොට මෙතැන ප්‍රත්‍යවීම කියන එක ගත්තහම අවිද්‍යාව කියන ධර්මයේ තුළ ප්‍රත්‍ය ශක්තීන් එකක් නෙවෙයි තියෙන්නේ. රාශියක් තියෙනවා.

- එතකොට අපි මුළින් කතාකරා අවිද්‍යාව කියන එකෙන් අරමුණ මුළාකිරීම කියන දේත් කරන්න පුළුවන්. අරමුණේ ඇති තතු පෙන්නන්නේ නැහැ. ඇති තතු වහලාදානවා. ඒක මම පෙන්නුවා, දැන් කෙනෙකුට යම් රූපයක් අරහයා ඒකේ ඇත්තත් පෙනෙනවා. තව කෙනෙකුට ඒක මනුෂ්‍යයෙක් හැටියට ත් පෙනෙනවා. එහෙනම් මෙතැන දෙන්නාගේ යම් ශක්ති ධර්මතා දෙකක් ක්‍රියාත්මක වෙලා තිබුණා. අන්න ඒ නිසා තමයි කියන්නේ අවිද්‍යාව යෙදිච්චි කෙනාගේ අරමුණේ ඇත්ත වහලා දානවා. මේ අවිද්‍යාවෙන් කරන දෙයක්.
- ඒ වාගේ ම අවිද්‍යාවෙන් තව කරන වැඩක් තමයි, වැරැදි දෙයක් පෙන්නලා දෙනවා. මවලා දෙනවා. මේකත් අවිද්‍යාව යි. කුණප කොටස් තියෙන තැනක, ධාතු සමූහයක් තියෙන තැනක, සත්ත්වයෙක් හැටියට පෙන්නලා දෙනවා. මැණික් නොවන දෙයක් මැණික් හැටියට පෙන්නනවා. රත්තරන් නො වන දෙයක්

රත්තරන් හැටියට පෙන්නනවා. ඒ විදියට මේ වැරැදි දෙයක් පෙන්නන බවත් අවිද්‍යාව තුළ තියෙන කාරණාවක්.

ඊළඟට මේ අවිද්‍යාව ප්‍රත්‍යවෙන ආකාරය ගත්තහම දැන් ඒ ප්‍රත්‍යයේ දී එක ම ප්‍රත්‍යය තුළ විවිධ ආකාරයේ ශක්ති තියෙනවා. ඒ ශක්තිය අනුව ප්‍රත්‍යවෙනවා. විවිධ ආකාරයෙන් ප්‍රත්‍යවෙනවා කියන එකට, දැන් උදාහරණයක් වශයෙන් ගත්තහම සංඛාරයට තව රාශියක් ප්‍රත්‍ය තියෙන්න පුළුවන්. එතකොට ඒ ප්‍රත්‍යයන් ද ප්‍රත්‍යවෙනවා. අවිද්‍යාව ප්‍රත්‍යවෙන්නේ මොන ආකාරයෙන් ද කියන එක යි අපි මෙතැන විග්‍රහකරගන්නේ. ඒ වාගේ ම මේ අවිද්‍යාව ප්‍රත්‍යවෙන ආකාරත් බොහොමයක් තියෙනවා. එක ම ධර්මය කොහොම ද ප්‍රත්‍යවෙන්නේ කියලා අපි මුලින් කතා කරා.

- යම් මනුෂ්‍යයෙක් වස්ත්‍රයක් ඇඳගත්තහම ඒ වස්ත්‍රයේ තියෙන එක ම කාරණාව කෙනෙක් තුළ ලෝභය ඇතිකරන්න මේ වස්ත්‍රය හේතුවෙලා තියෙනවා. ඒක එක ආකාරයක්. ඒක වීමක්.
- කෙනෙකුගේ ලෝභයක් ඇතිවෙන්නේ නැහැ ඒ වස්ත්‍රයේ අලංකාර බව නො තිබුණා නම්. එක ම වස්ත්‍රය තව කෙනෙකුට ශීත නැතිකරන්න, උෂ්ණ නැතිකරන්න ප්‍රත්‍යවෙලා තියෙනවා.
- ඒ වාගේ ම ඒ වස්ත්‍රය අනික් කෙනාගේ ශරීරයේ නො පෙනෙන තැන් වහලා මේ විදියට කටයුතු කරන්නත් ප්‍රත්‍යවෙලා තියෙනවා.

ඒ වාගේ මේ වස්ත්‍රය කියන එක කෙනෙකුට ලෝභයක් ඇතිකරන්නත් තව කෙනෙකුට තරහක් ඇතිකරන්නත් ප්‍රත්‍යවෙනවා. ශීත-උෂ්ණ නැතිකරන්නත් ප්‍රත්‍යවෙලා තියෙනවා. මේ විදියට අවිද්‍යාව කියන එක විවිධ

ආකාරයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන්. හොඳයි අපි ඒක පිළිබඳව වැඩිය කතා නොකර අපි බලමු මේක.

- පුණ්‍යාභිසංඛාරයට අවිද්‍යාව දෙපරිද්දකින් ප්‍රත්‍යවෙනවා. එතකොට පුණ්‍යාභිසංඛාර කියලා කිව්වේ කුසල් සිතට යි. කුසල් සිතට ආකාර දෙකකින් ප්‍රත්‍යවෙනවා.
- අපුණ්‍යාභිසංඛාරයට නොයෙක් ආකාරයෙන් ප්‍රත්‍යවෙනවා. අකුසල්වලට විවිධ ආකාරයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන්.
- ආනෙඤ්ජාභිසංඛාර කියපු අරූපාවචර ධර්මයන්ට එක් ආකාරයකින් ප්‍රත්‍යවෙනවා.

මේ ප්‍රත්‍යවීම අවිද්‍යාව ප්‍රත්‍යවෙන ආකාරය යි.

පුණ්‍යාභිසංඛාරයට අවිද්‍යාව ආලම්බන ප්‍රත්‍යයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් කියන ප්‍රත්‍ය දෙකෙන් ප්‍රත්‍යවෙනවා. එතකොට ආලම්බන ප්‍රත්‍ය කියලා කියන්නේ: අවිද්‍යාව අරමුණුවෙලා කෙනෙකුට කුසල් ඇතිවෙන්න පුළුවන් කියලා යි මේ කියන්නේ. ඒක ඔබට තේරෙන්නේ නැතිවෙයි.

ඒකට අපි මෙහෙම උපමාවකින් කිව්වොත්: අවිද්‍යාව කෙනෙක් නෙවෙයි, තමන්ගේ මෝඩකම යි. මෝඩකම කිව්වේ නුවණින් අරමුණු කරනවා. නුවණින් අරමුණු කරළා මේ මෝඩකම පිළිබඳව සම්මර්ශණය කරනවා. අපි මේ මේක පිළිබඳව විදර්ශනා කරනවා නේ. මෝඩකම කියන්නේ මොකක් ද කියලා අපි තේරුම්ගන්නවා. අපි අපේ කයට යොමුවෙළා, දැන් මේක “මම“ කියලා යෙදෙනවා. ‘මෙතැන තියෙන්නේ සතරමහාධාතු ධර්ම සමූහයක්. මේ සතරමහාධාතු ධර්ම සමූහය තියෙන තැනක පුද්ගලයෙක් කියලා වැටැහෙන්නේ නොදන්නාකම නිසා නේ ද‘ කියලා ඔන්න සම්මර්ශණය

කරනවා. දැන් එතැන මොකද වෙලා තියෙන්නේ? දැන් මෙතැන ඒ සම්මර්ශණයඥානය -සම්මර්ශණය කියලා කියන්නේ ප්‍රබල ඥානසම්ප්‍රයුක්ත කුසල් සිතක්.-

**මේ සම්මර්ශණය ඥානයට අවිද්‍යාව යි අරමුණු වෙලා තියෙන්නේ. අවිද්‍යාව අරමුණුවෙලා එයාට පුණ්‍යාභිසංඛාරයක් ඇතිවුණා.**

අන්න ඔය විදියට තමයි මේ අවිද්‍යාව කුසලයට අරමුණුවෙන්නේ. ආරම්මන ප්‍රත්‍යයෙන් අරමුණුවෙනවා කියන එක ආරම්මණ ප්‍රත්‍යය කියන එක දැනගන්නවා. එතකොට ආරම්මණ ප්‍රත්‍යයේ දී මේක ප්‍රත්‍යවෙන ආකාරයෙන් එක ම අරමුණ ගත්තොත්,

- අකුසලය අකුසලයටත් ආරම්මන ප්‍රත්‍යය වෙනවා.
- අකුසලය කුසලයටත් ආරම්මණ ප්‍රත්‍යය වෙනවා.
- අකුසලය ආනෙඤ්ජාභිසංඛාරයටත් ආරම්මණ ප්‍රත්‍යය වෙනවා.

එතකොට අරමුණුවීම වෙච්චි පමණකින්, ඒක හිතේ යෙදිලා කියලා වටහාගන්න එපා.

අපි කියමුකො අප තුළ ලෝභය යෙදිලා, ඒ ලෝභය යෙදිලා නැවත ලෝභය උපදින්න ම ලෝභය හේතුවෙනවා. ලෝභය අරමුණුවෙනවා. එතකොට අකුසලය අකුසලයටආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා.

ඊට පස්සේ අකුසලය කුසලයට අරමුණුවෙන්නේ කොහොම ද? කෙනෙක් අර කිව්වා වාගේ අකුසලයක්, ද්වේෂයක් ඇතිවුණහම ද්වේෂය අරමුණුවෙලා, 'අනේ මා තුළ ද්වේෂය හටගත්තා නේ ද, මේ ද්වේෂය ඇතිකරගන්න හොඳ නැහැ' කියලා හිතනවා. අන්න අකුසලයක් අරමුණුවෙලා ඔහුට කුසල් ඇතිවෙනවා.

- ඒ නිසා තමයි කියන්නේ ***අකුසල ධම්මං පටිච්ච අකුසල ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.*** අකුසල ධර්මයක් අරම්මණ ප්‍රත්‍යයේ දී පෙන්නන්නේ. අකුසල ධර්මයක් ප්‍රත්‍යවෙලා අකුසලයක් උපදින්නත් පුළුවන්.
- ***අකුසල ධම්මං පටිච්ච අකුසල ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.*** අකුසල ධර්මයක් අරමුණුවෙලා කුසලධර්මයෝ උපදින්නත් පුළුවන්.
- ***අකුසල ධම්මං පටිච්ච අබ්‍යාකත ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.*** අබ්‍යාකත කියලා කියන්නේ මෙතැන මේ කුසල් හෝ අකුසල් නො වන ධර්මයෝ කියන එක යි. එතකොට විපාක ටික ඊට පස්සේ ක්‍රියා ටික. මේවා තමයි අව්‍යකෘත කියලා කියන්නේ.

එතකොට අව්‍යාකෘතය කොටස් දෙකකට බෙදනවා. අව්‍යාකත කියලා කිව්වේ කුසල් හෝ අකුසල් වශයෙන් නො කියන ලද දේවල් අව්‍යාකෘත ධර්ම යි. එතකොට අව්‍යාකතයේ,**විපාක අව්‍යාකත, ක්‍රියා අව්‍යාකෘත කියලා බෙදනවා**.

**විපාක අව්‍යාකෘත** කියලා කියන්නේ අපට කර්මයට ලැබුණු විපාක ටික යි. මේ විපාක ඇතුළේ කුසල් නැහැ නේ. විපාක ඇතුළේ අකුසලුත් නැහැ. එතකොට මේ විපාකයෙන් කවදාවත් ප්‍රතිසන්ධි දෙන්නේ ත් නැහැ. ඒ විපාකය කියන එක අපි උත්සාහයෙන් ඇතිකරගත්තු එකක් නෙවෙයි. විපාකය කියන එක පෙර අපි කරපු කර්මයේ ආනුභාවයෙන්, කර්මයේ ශක්තිය නිසා ලැබිච්චි එකක්. ඒකට අපට මොකුත් කරන්න පුළුවන්කමක් නැහැ. ඉතින් ඒ නිසා ඒ විපාකයට ත් මේ ආරම්මණ ප්‍රත්‍යය වෙන්න පුළුවන්. එතකොට අව්‍යාකතයේ විපාක අව්‍යාකත.

**ක්‍රියා අව්‍යාකත** කියලා කියන්නේ කුසල ද නො වූ, අකුසල ද නො වූ, කර්ම විපාක ද නො වූ සිත් ටිකක් තියෙනවා. දැන්

රහතන් වහන්සේලා එදානෙදා කටයුතු සිද්ධ කරනකොට ඒ සිද්ධ කරන්නේ උන්වහන්සේලා මේ ක්‍රියා සිත් උපයෝගී කරගෙන යි. මේ ක්‍රියා සිත් තුළ, ධර්මයේ සඳහන්වෙන්නේ ***නෙව කුසලං නා අකුසලං***- කුසලත් නො වූ, අකුසලත් නො වූ, ***න ච කම්ම විපාකා*** - කර්ම විපාක ත් නො වුණු සිත් ටිකක් තියෙනවා. ඒවා රූපාවචර, අරූපාවචර, කාමාවචර කියලා මේ සිත් ටික පෙන්නනවා. එතකොට මේවාට ත් අරමුණු වෙන්න පුළුවන්.

මේ ආරම්මණ ප්‍රත්‍යය කියන එකයි, මම විස්තර කරේ, මොකද මේ පුණ්‍යාභිසංඛාරයට අවිද්‍යාව ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා කියනකොට කෙනෙකුට මේක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඇයි එයාට ප්‍රශ්නයක් වෙන්නේ? අවිද්‍යාව කියන්නේ අකුසලයක් නේ. අවිද්‍යාව කියන්නේ තනිකර අනිෂ්ඨ විපාක දෙන දෙයක්. ඒක කොහොම ද ප්‍රත්‍යවෙන්නේ කුසල් කරන්න? කියලා මේකේ අපට හරියට පැහැදිලි නැතිබවක් යෙදෙන්න පුළුවන්. ඒක අපි ඉදිරියේ දී පැහැදිලි කරගනිමු.

දැන් මම මේ කතාකරන්නේ ඒ ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව යි. ඒක කොහොම ද වෙන්නේ කියන එක පිළිබඳව අපි ඉදිරියේ දී එනවා. ඒක එතකොට ආලම්බණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන් කුසලයට. ඒකයි මම කිව්වේ අරමුණුවෙච්ච් පමණකින් අපි තීරණය කරන්න හොඳ නැහැ, ඒවා හිතේ යෙදෙනවා කියලා. ආරම්මණභාවය විතරයි මෙතැන සඳහන් වෙන්නේ.

ඒ නිසා එක ම අරමුණ වෙලා කෙනෙකුට කුසල් අකුසල් අව්‍යාකෘතව උපදිනවා. එකම අරමුණේ කෙනෙකුට ලෝභය එනවා. එකම අරමුණේ ද්වේශය එනවා. කුසල එකම අරමුණේ කෙනෙකුට රාගය එනවා. ඇයි මේ වුණේ?

ඒක ආරම්මණයේ තියෙන දෝශයක් නෙවෙයි. අරමුණ අපි ගන්නා ආකාරයේ තියෙන දෝෂයක්. යම් අරමුණක තරහා ආවා නම් එයාට අරමුණේ එකම රූපාලම්බනය වෙන්න පුළුවන්. තව කෙනෙකුට ලෝභය ආවානම්, ඒ අරමුණත් එක ම රූප ආලම්බනය වෙන්න පුළුවන්. ඉතින් අන්න ඒ විදියට, ඒ නිසා තමයි මෙතැන කියන්නේ අවිද්‍යාව සංඛාරයට ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන්, පුණ්‍යාභිසංඛාරයට. ඊට පස්සේ අවිද්‍යා චිත්තයෙන් සමොහ සිත දැනගන්නා කල රූපාවචර පුණ්‍යාභිසංස්කාරයට ද ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. එතකොට කෙනෙක්ව මෙතැන රූපාවචර අභිඥා උපදවාගත්තු කෙනෙක් එයාට පුළුවන් අනුන්ගේ හිත් බලන්න. එතකොට තව කෙනෙකුගේ හිතක තියෙන මෝහය කියන, මෙයාගේ මෙතැන මේ මෝහය යෙදුනා නේ ද. මෙයාගේ මෙතැන මේ හිතේ ද්වේෂය යෙදිලා නේ ද. මේ මොහුට ද්වේශ සිතක් ඉපදිලා. දැන් මේ සද්ද නැතුව හිටියාට ඔහු මේ ඉන්නේ ද්වේෂයෙන් කියලා අභිඥාව, පෙර සිත් දන්නා කෙනෙක් තේරෙනවා එයාට.

එතකොට ඒ වාගේ කෙනෙක්ව මේ අභිඥා සිතෙන් කෙනෙක් තවත් කෙනෙකුගේ ඒ වාගේ අවිද්‍යාව මෝහය අරමුණු වෙනකොට ඒ අභිඥා සිත කියන රූපාවචර පුඤ්ඤාභිසඞ්ඛාරයට අවිද්‍යාව ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා තියෙනවා. අන්න එතකොට අවිද්‍යාව පුඤ්ඤාභිසංඛාරයට ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙන්නේ කොහොම ද කියන එකයි දැන් කතා කරන්නේ. අරමුණුවීම කියන එක.

**ආලම්බන ප්‍රත්‍යය** කියන එක අපි ඉගෙනගන්න ඕන. ඒක බොහෝම රසවත් වටිනා මාතෘකාවක්. ඒක අපට හම්බවෙන්නේ මේ පට්ඨානයේ සූවිසි ප්‍රත්‍ය න්‍යායයේ යි. ආරම්මණ ප්‍රත්‍යයටත් හැම සකල ධර්මයෝ ම ආලම්බන

ප්‍රත්‍යයට යි අයිති. මොකද <u>යම් සිතක් උපදිනවා නම් ඒ ආලම්බනයකින් තොරව උපදින්නේ නැහැ</u>. ඒ නිසා යම් ධර්මයක් උපදිනවා නම් යමක් අරමුණුවෙලා ම යි උපදින්නේ. එතකොට ඒ ඒ සිත් උපදින්න උපකාරවෙන අරමුණට ආරම්මන ප්‍රත්‍යය කියලා කියනවා. ඒ ප්‍රත්‍යය ශක්තියක් ඒ තුළ තියෙනවා. සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක වේවා, මේකේ ප්‍රත්‍ය ශක්තියක් තියෙනවා.

උදාහරණයක් වශයෙන් අපි කියමුකෝ අපි පාරේ යනකොට කෙනෙකුට කරදාසි කොළයක් හම්බවෙනවා. තවත් ටිකක් යනකොට ඒ කඩදාසිවලින් ම හදලා තියෙන, අපි කියමු රුපියල් දාහක් කියලා. ඒකත් දකිනවා. දෙක ම ගත්තොත් කඩදාසි යි. දෙකම අර වර්ණ රූප සටහණක් අපට හම්බවෙන්නේ. නමුත් එකක් අරමුණුවෙන කොට මෙහේ පුදුමාකාරයේ බලවත් ලෝභයක් උපදිනවා. එයා තුළ බොහෝ සිත්සතන් උපදින්න අර එක කඩදාසි කොලයක්, අපි මුදල් කියලා කියන එක දැක්කහම එතකොට එහෙනම් ඒ අරමුණ තුළ තියෙනවා නේ ද යම් සිත් ඉපැද්දවීමේ හැකියාවක්. නිකම් කඩදාසි කොලයක්, දිරච්චි කොලයක් දැක්කාට අපට ඒකේ එහෙම බලවත් සිත් උපදින්නේ නැහැ. අන්න ඒක තමයි **ප්‍රත්‍ය ශක්තිය** කියලා කියන්නේ. අන්න ඒක අපි තේරුම්ගන්න ඕන දෙයක්.

අරමුණක් තුළ එහෙම ශක්ති තියෙන්න පුළුවන්. එතකොට ඒ විදියට ගත්තහම ආලම්බන ප්‍රත්‍ය වෙන ධර්ම, සකල ධර්මයෝ ම ආලම්බන ප්‍රත්‍ය වෙනවා. හැබැයි ප්‍රත්‍යයෙන් උපදින ධර්මයෝ ගත්තහම චිත්ත චෛතසික ධර්මයෝ විතරයි ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යඋප්පන්න ධර්මයෝ වෙන්නේ. එතකොට **සාලම්බන ධර්මයෝ, අනාලම්බන ධර්මයෝ** කියලා අපේ ධර්මයේ බෙදෙනවා නේ. ඒ කියන්නේ අරමුණු ගත හැකි ධර්ම ටිකක් තියෙනවා.<u>අරමුණු ගන්න පුළුවන් චිත්ත චෛතසිකයන්ට විතර යි. රූපයෙන් අරමුණු ගන්න බැහැ.</u>ඒක

තේරුම්ගන්න ඕන. ඒ නිසා රූපය අනාලම්බනයි කියලා කියනවා. අනාලම්බනයි කියලා කියන්නේ රූපය අරමුණු කරන්න බැහැ කියන එක නෙවෙයි. අරමුණු ගත නොහැකියි රූපයට. ඒ විදියට රූපයට අරමුණු අරගෙන උපදින්න පුළුවන්කමක් නැහැ. දැන් අපි ඒක දන්නවා. නමුත් ඒ වුණාට මෝඩකම අප තුළ යෙදෙනවා නේ. දැන් අපි දන්නවා අපි මේ හමට හිතන්න බැහැ කියලා. අපි හිතුවොත් තේරෙනවා. අපි ඇහැට, කනට මේ ඇහීමේ හැකියාවක් නැහැ කියලා තියෙනවා. නමුත් අපට මොනවා හරි දෙයක් ඇහෙනකොට,'මගේ කනෙන් ඇහුවේ. මේ ඇස් දෙකෙන් ම යි දැක්කේ' කියලා අපි මෝඩකමට පත්වෙනවා. නමුත් ඇත්ත බැලුවහම මේ රූපයට කවදාවත් දැකීම කරන්න බැහැ. හිතෙනුයි ඒ අරමුණ දැක්කේ. නමුත් අපි මුලාවයට යනවා ඇහෙන් දැක්කා කියලා.

අන්න ඒ ආලම්බන සාලම්බනභාවය තේරුම් ගැනීමත් සම්මාදිට්ඨියට පත්වෙන්න හේතුවෙන එකක්. ඒ නිසා අරමුණු ගතහැකි ධර්මයෝ චිත්ත චෛතසික ධර්මයෝ යි. සිත හා චෛතසික ධර්මයන්ට කියනවා සාලම්බන ධර්ම කියලා. අනාලම්බන ධර්ම හැටියට පෙන්නන්නේ ***රූපඤ්ච නිබ්බානඤ්ච අනාලම්බනං*** කියලා පෙන්නනවා. එතකොට නිවනටත් අරමුණු ගැනීමට බැහැ. රූප ධර්මයන්ටත් අරමුණු ගත නොහැකියි. ඒකෙන් කියන්නේ අරමුණු කරන්න බැහැ කියන එක නෙවෙයි, එවාට අරමුණු කරළා උපදින තැන්.

අපට පුළුවන් අපට රූපයක් අරමුණු කරළා සිත් උපදවාගන්න. රූපයට පුළුවන් ද තවත් මොනවා හරි දෙයක් අරමුණු වෙලා රූප උපද්දවාගන්න? එහෙම පුළුවන්කමක් නැහැ. අන්න ඒක නිසා මේ ආලම්බන ප්‍රත්‍යය කියන එක අපි දැනගන්න ඕන.

ඊට පස්සේ ප්‍රත්‍යවෙන්නේ, පුඤ්ඤාභිසංඛාරයට ප්‍රත්‍යවෙන්නේ ඊට පස්සේ ආලම්බන ප්‍රත්‍යයෙන්

ප්‍රත්‍යයවෙනවා. අවිද්‍යාව ඉක්මවීම පිණිස දානාදී කාමාවචර පුණ්‍යක්‍රියාවක් සිදුකරන්නාට උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යයවෙනවා. අන්න එතැන වැදගත් කාරණාවක්. අපි ගිය සැරේ කිව්වා මේක පිළිබඳව කතාකරනවා කියලා. උපනිශ්‍රයප්‍රත්‍යය පිළිබඳව, මේ උපනිශ්‍රයප්‍රත්‍යය පිළිබඳව කතා කරලා මම නතරකරනවා. ඒ ප්‍රත්‍යය වෙන භාවයන් පිළිබඳව අපි ඊළඟ සැරේ දී කතාකරමු.

**උපනිශ්‍රයප්‍රත්‍යය:** එතකොට මේ පුණ්‍යාභිසඞ්ඛාරයන්ට අවිද්‍යාව උපනිශ්‍රයප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යයවෙනවා කියලා කියනවා. මේ උපනිශ්‍රය නිශ්‍රයප්‍රත්‍යය, උපනිශ්‍රයප්‍රත්‍යය කියලා ප්‍රත්‍ය ශක්තීන් දෙකක් තියෙනවා. දැන් අපි මේ කතා කරන්නේ: ඔබ හොඳට තේරුම්ගන්න, අවිද්‍යාව කියන ධර්මය නිසා අපට කුසල් ඇතිවෙනවා කියලා අපි කතා කළා.  අවිද්‍යාව කියන ධර්මය නිසා අපට කුසල් ඇතිවෙනවා කියලා කිව්වාට මේ අවිද්‍යාව කුසල් ඇතිකරගන්න හේතුවෙන්නේ මොන ආකාරයෙන් ද කියන එක ඒ වචනය තුළ නැහැ. ඒ ප්‍රත්‍යශක්තිය ඒ තුළ නැහැ. අන්න ඒකයි දැන් අපි තේරුම්ගන්නේ, අවිද්‍යාව කුසල් ඇතිකරන්න එන්නේ මොන ආකාරයෙන් ද?

එකක් කිව්වා අරමුණුවීම් වශයෙන් ප්‍රත්‍යයවෙනවා. අනිත් එක කිව්වා උපනිශ්‍රය වශයෙන්, ඒ කියන්නේ අවිද්‍යාව ඇති නිසා ම මේ කුසල් ලෝකයා කරනවා. එතකොට උපනිශ්‍රය කියලා කියන්නේ බලවත් උපකාරය කියන එකයි.  බලවත් උපකාරය. දැන් උපකාරය යෙදෙනවා බෙදෙනවා. උපකාරත්වය කියන එක. එතකොට බලවත් ලෙස ඇති කරන උපකාරත්වයක් තියෙනවා නම් ඒක තමයි උපනිශ්‍රයප්‍රත්‍යය කියලා කියන්නේ. නිශ්‍රයප්‍රත්‍යය කියලා කියන්නේ එකට යෙදීම වශයෙන්  ඇතිවෙන උපකාරය යි.

දැන් අපි කියමුකෝ ඔතැන අර **නලකලාප සූත්‍රයේ**[7] තියෙන්නේ: බට කෝටු තුනක් හරි දෙකක් හරි රඳවලා තියන්න ඔවුනොවුන්ට එක කෝටුවක් අනික් කෝටුවට උපකාර වෙලා මේ දෙක වැටෙන්නේ නැතුව තියෙනවා. මේ දෙක වැටෙන්නේ නැතුව තියෙන්නේ ඔවුනොවුන්ට කරගන්න උපකාරය නිසා යි. මේකට තමයි නිශ්‍රය වෙනවා කියලා කියන්නේ. නිශ්‍රයප්‍රත්‍ය කියන්නේ. ඇසුරුකරගෙන පවතිනවා කියන එක යි. උපනිශ්‍රය කියලා කියන්නේ බලවත් ලෙස ඇතිකරන උපකාරයක්. ඒ නිශ්‍රයවුණ පමණකින් සමහර දේවල් උපදින්න ඕන. නමුත් සමහර දේවල්වල තියෙනවා නිශ්‍රයවීම බලවත් ලෙස වීම නිසා අපට බොහෝ සිත් උපදින්න පුළුවන්. ඒක වටිනා දෙයක්. **මේ නිශ්‍රයප්‍රත්‍යය කොටස් තුනකට බෙදෙනවා. ආලම්බන උපනිශ්‍රය,අනන්තර උපනිශ්‍රය, හා ප්‍රකතූපනිශ්‍රය කියලා කොටස් තුනකට බෙදනවා.**

**ආලම්බන උපනිශ්‍රය:**ඒ කියන්නේ මේ බලවත් ලෙස උපකාර කිරීම අරමුණක තියෙන බලවත්භාවය නිසා නිශ්‍රයවෙනවා. ආලම්බන උපනිශ්‍රය කියලා කියන්නේ ඒකයි. දැන් අපි කියමුකො යම් දෙයක් අපට මැණිකක් වගේ දකින්න ලැබෙනවා. මේ මැණිකක් වගේ දකින්න ලැබෙන කොට නිධානයක් වගේ, මැණිකක් වගේ ඒ වාගේ ලක්ෂණ රූපයක් දකින්න ලැබෙනකොට මේකේ තියෙන, අන්න ඒ අරමුණේ තියෙන බලවත්භාවය නිසා ප්‍රත්‍යවෙලා අපට ලෝභය උපදින්න පුළුවන්. ද්වේශය උපදින්න පුළුවන්. කුසල් උපදින්න පුළුවන්. අපි කියමුකෝ, රුවන්වැලිසෑය වගේ අපට සිහිවෙන කොට මේ රුවන්වැලිසෑයේ තියෙන ගරුකළයුතුබව මේක නිසා අපට බොහෝ සිත් උපදිනවා. එතකොට එතැන තිබුණේ නිකම් ම අරමුණුවීමක් නෙවෙයි. බලවත් ලෙස අරමුණුවීමක්. ඒකේ තිබුණ ගරුභාවය නිසා අපට ඒ තුළ බොහෝ ශ්‍රද්ධාදී කුසල ධර්‍මයන් උපදවන්න හේතුවුණා. අන්න

[7]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය 2 – 176වැනි පිටුව.

ඒකට තමයි කියන්නේ ආලම්බන උපනිශ්‍රය කියලා කියන්නේ. එහෙම උපනිශ්‍රයභාවයන් තියෙනවා. එතකොට පුන්‍යාභිසඞඛාරයට ඒ විදියට ආලම්බන උපනිශ්‍රයෙන් ම ප්‍රත්‍යය වෙනවා. ඊට පස්සේ ඊළඟ තමයි මේ උපනිශ්‍රය කියන එක අපි කොටස්වලට බෙදාගත්තේ. ආලම්බන උපනිශ්‍රය, අනන්තර උපනිශ්‍රය කියලාත් ප්‍රත්‍යයක් තියෙනවා.

**අනන්තර උපනිශ්‍රය:** භාවය කියලා කියන්නේ එකකට අනතුරුව තව සිතක් ඉපදීම කියන මේ අනන්තර ප්‍රත්‍යය කියලා කියනවා. එතකොට අනිවාර්‍යයෙන් ම මුල් සිත හටගැනිලා නිරුද්ධවෙනවාත් සමග ම ඊළඟ සිත උපදිනවා ම යි. මේකට තමයි අනන්තරභාවය කියලා කියන්නේ. උදාහරණයක් වශයෙන් අපි ගත්තොත් චකඛු විඤ්ඤාණයට අනතුරුව සම්පටිච්ඡන සිත උපදිනවා. චකඛු විඤ්ඤාණ සිත ඉපදුනේ නැතිනම් සම්පටිච්ඡණය උපදින්නේ නැහැ. ඒ නිසා අනන්තරභාවය කියන එක අපි කියමුකො, සෝවන් මාර්‍ග සිතට අනතුරුව ම සෝවාන් ඵල සිත මේ අතර කවදාවත් වෙන සිතක් උපදින්න බැහැ. මාර්‍ගයට අනතුරුව ඵලය උපදින බව අනන්තර ප්‍රත්‍යයෙන්.එතකොට ඒ වාගේ එතැන ගෝත්‍රභූ සිතට අනුව මාර්‍ග සිත උපදින බව අනන්තර ප්‍රත්‍යයෙන්. අන්න ඒ වාගේ ඒ පළමුවෙනි ජවනයට අනුව දෙවන ජවනය උපදින්නේ. අනන්තරභාවයෙන් උපකාරවන බවකුත් තියෙනවා.

ඒ කියන්නේ අපි කියමුකො මුලින් හටගත්තු සිත ඇඩි බලවත්වූ සිතක් නම් ඒ වාගේ ම තව සිතක් උපදින්න මුලින් හටගත්තු සිත උපකාරවෙලා තියෙනවා අනන්තරභාවයෙන්. අන්න එතකොට ඒක තමයි මෙතැන අනන්තර උපනිශ්‍රය කියලා කියන්නේ. ඒක උදාහරණයක් වශයෙන් ගත්තොත් මුලින් මුලින් අපට බලවත් ලෙස අවිද්‍යාව යෙදුන නිසා, ඊළඟ නැවත නැවත අපට අවිද්‍යාව යෙදෙන්න හේතුවෙනවා. ඒ වගේ ම අපි කුසලයක් කරන කොට දැන් අපි

ඉස්සෙල්ලාම කතාකරපු එක, ආලම්බන ප්‍රත්‍යය කියන එකේ ම, ඒකෙම තියෙන කොටසක් ආලම්බන ප්‍රත්‍යය ශක්තිය කියන එක තව එකක්. ආලම්බන උපනිශ්‍රයභාවය කියන්නේ තව එකක්. මේක ඔබ තේරුම්ගන්න. මේක සමහරවිට ඔබට ගැඹුරු වෙන්න පුළුවන්. මේක මේ පට්ඨානයේ තියෙන කාරණාවක් මම මෙතැනට ගන්නේ. නමුත් මේවා මේ අපි පටඨානයේ ඕවා මේ වැඩක් නැහැ කියලා අපි පැත්තකට දාන්න නෙවෙයි. අපි මෝඩකම ගෙවාගන්න මේවා ලිහිල්කරළා විග්‍රහකරගත්තහම, ඒවා අභිධර්මය වෙන්න පුළුවන්. පට්ඨානයේ තියෙනවා වෙන්න පුළුවන්. නමුත් ඒකේ කොටස් අරගෙන ලිහිල්කරගත්තොත් ඒවා පුදුමාකාර උපකාරවෙනවා අපේ අනාත්මය ගෙවාගන්න, ඒ වාගේ ම අපි දර්ශනයේ පැහැදිලිකරගන්න හේතුවෙනවා.

එතකොට මෙතැන ආලම්බන ශක්තිය කියන එක තව එකක්. උපනිශ්‍රයභාවය කියන එක තව එකක්. දැන් අපි කියමුකො මෙතැන පුඤ්ඤාභිසඞ්ඛාරයට උපනිශ්‍රයවෙනවා කියන එකේ දී, දැන් උදාහරණයක් වශයෙන් ගත්තොත් කෙනෙක් අවිද්‍යාව අරමුණුවෙලාඑයාට බලවත් ලෙස මේ මෝඩකම වැටැහෙනවා. එයාට හොඳට තේරෙනවා. ඇත්තට ම මේ සතරමහාධාතු ටිකක් තියෙන තැනක මේ “මම“ කියලා මේකට ආරෝපනය කරගන්නේ මෝඩකම නිසා නේ ද? පඹයාට මනුස්සයෙක් කියලා රැවැටෙන්නේ මේ පඹයෙක් තියෙන තැන, ලී කෑලි ටිකක් තියෙන තැන මනුස්සයා කියන අදහසක් ආවේ, ඡායාව කෙරෙහි බල්ලාට තවත් බල්ලෙක් කියන අදහසක් ආවේ, මේ සිතීම නේ ද මේ හේතුවුණේ. එතැන තිබුණේ මෙහෙම ධර්ම ටිකක් නේ ද කියලා ඒක බලවත් ලෙස තේරීම නිසා නැවැත නැවැත ඒ වාගේ විදර්ශනා ඥාන උපදින්න මුලින් මුලින් හටගත්තු අර ඥාන හේතුවෙනවා. අන්න ඒකට තමයි මේ අවිද්‍යාව ආලම්බන උපනිශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා, අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍ය වෙනවා කියලා කිව්වේ. අනන්තර උපනිශ්‍රය කියලා කිව්වේ

මුලින් බලවත්ව ඉපදිච්චි ඥානය ඒ නිසා ඒක නිරුද්ධවුණායින් පස්සේ එබඳු තව තව ඥානයන් උපදින්න මුලින් හටගත්තු අර අවිද්‍යාව අරමුණුවෙලා හටගත්තු ප්‍රඥාව හේතු වුණා.

එහෙම හේතුවීම අපට පෙනෙන්න නැහැ. අපි මේ අල්ලලා, මේ දැකලා අහලා දැනගන්න පුළුවන් දේවල් නෙවෙයි. ප්‍රත්‍යශක්තියෙන් කියන ඒවා අපි තේරුම්ගන්න ඕන. මේකට ටිකක් නුවණක් තියෙන්න ඕනේ. සමාධි සිතකට තමයි ඒක තේරෙන්නේ. එහෙම වීමක් තියෙනවා නේ. දැන් අපට හොඳට යම් වෙලාවක අපේ මෝඩකම මේ පුද්ගලභාවය කියන එක අරමුණුවෙලා හොඳ විදශීනා ඥානයක් ඉපදුණොත්, මේ හිත නිසා අපටඉදිරියේ දී කොයි තරම් සිත් උපදිනවා ද. ප්‍රීතිය ඇතිවෙලා, සතුට ඇතිවෙලා, සමහර අය කියන්නේ, "අද හොඳට විදශීනාව වැඩුණා. කිසිම අපහසුවකින් තොරව විදශීනාව වැඩිලා මේ හේතු ඵල දහම, කර්‍මය මට හොඳට තේරුණා." කියලා කියන්නේ. දැන් මෝඩකම කියන එක  යම් වෙලාවක වැටැහිච්චි නිසා ඒ ඉපදිච්චි නිසි නිසා නැවැත නැවැත, මේ සමහරවිට පැය ගණනක්  එයාට ඒ විදශීනා ඥානයන් ලබාගන්න අර මෝඩකම කියන එක අරමුණුවුනා. හේතු වුණා. ඒ නිසා යි අපි තේරුම්ගන්නකම තියෙන්නේ. මේ  අවිද්‍යාව කියන එක සිතක් උපදින්න යෙදිලාත් ප්‍රත්‍යවෙනවා. නොයෙදී ත් ප්‍රත්‍යවෙනවා. ඒක තමයි මෙතැන අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ.

ඊට පස්සේ එතැන තියෙනවා පකතූපනිශ්‍රය ප්‍රත්‍යය කියලා. එතකොට අපි ඒ උපනිශ්‍රය ප්‍රත්‍යය කතා කරා, අනන්ත උපනිශ්‍රයභාවය,ආරම්මන උපනිශ්‍රයභාවය, සහ පකතූපනිශ්‍රයභාවය. දැන් ඊට පස්සේ පකතූපනිශ්‍රය කියන එක. මේක විග්‍රහකරගතයුතු වැදගත් කාරණාවක්. මේ කුසල්වලට විශෙෂයෙන් බලපාන්නේ පකතූපනිශ්‍රය කියන

කාරණාව යි. ඒ පකතූපනිශ්‍රය කියලා කියන්නේ මුලින් මුලින් හටගත්තු අපේ හිතේ පුරුදුවෙලා තියෙන සන්තානගත ධර්මයෝ අලුතෙන් අලුතෙන් සිත් උපදින්න හේතුවෙනවා. අපි ඒක උදාහරණයක් ගත්තොත් මේ අවිද්‍යාවට පුන්‍යාභිසඞ්ඛාර සකස්වෙන්නේ කොහොම ද කියන කාරණාව නැතුව ප්‍රකුර්තෝපනිශ්‍රය ප්‍රත්‍යය කියන්නේමොකක් ද කියන එක ඉස්සෙල්ලා විග්‍රහකරගනිමු. දැන් බලන්න සමහර අය ස්වභාවයෙන් ම ශ්‍රද්ධාවන්ත යි. සසර ඔහු ශ්‍රද්ධාව නමැති ධර්මය පුරුදුකරළා තියෙන නිසා මඔහුට ස්වාමීන් වහන්සේ නමක් දැක්කහම, පිළිම වහන්සේ නමක් දැක්කහම, පුදුමාකාරයේ ශ්‍රද්ධාධික සිත් උපදිනවා. ධර්ම කාරණාවක් වැටහෙන කොට, කවුරුහරි කියන කොට ඔහු පෙර මේ ධර්ම කාරණාව විදර්ශනා ඥානයකින්, භාවනාවකින් දැකලා තියෙන නිසා අරක ඇහෙනකොට ම ඔහුට පුදුමාකාරයේ වටිනා සිත් උපදින්න පුළුවන්. කුසල් සිත් උපදින්න පුළුවන්. එතකොට එහෙනම් අර පෙර කරලා බලවත් වෙච්චි ධර්මයෝ තිබුණ නිසා පසුව පසුව බොහෝ සිත් උපදින්න හේතු වෙනවා. අන්න ඒකට තමයි ප්‍රකුතෝපනිශ්‍රය ප්‍රත්‍යය කියන්නේ. ඔහුට ප්‍රකෘතියෙන් ම ඇතිවෙලා තියෙන ඇතැම් හුරුපුරුදු නිසා, දැන් අපි පාරමී කියලා කියන්නෙත් අන්න ඒවාට යි. සසර දන් දීලා තියෙන කෙනාට එහෙම අවස්ථාවක් එනකොට ඒක ඉහල අයුරින් දෙනවා. එහෙම ප්‍රත්‍යවීමක් වෙන්නේ නැද්ද මෙතැන? ප්‍රත්‍ය ශක්තියක්. ඔබට හොඳට තේරෙනවා. අන්න ඒ ප්‍රත්‍ය ශක්තියට තමයිප්‍රකුතෝපනිශ්‍රය ප්‍රත්‍යය කියලා කියන්නේ.

තවත් උදාහරණයක් ගත්තොත්, අපි කියමුකෝ සසරේ ද්වේශය මුල්වෙලා කර්ම කරපු කෙනෙකුට ද්වේශ බහුල චරිතයක්. ඒ වාගේ මේ ජීවිතයේත් සමහර විට එයා රක්‍ෂාවත් එක්ක ගැටෙන එක ම යි සිද්ධවෙන්නේ. දැන් බලන්න ඒ නිසා පසුකාලයක ඔහුගේ පොඩි අරමුණෙත් තරහා යනවා. කේන්ති යනවා. කේන්තිය අරමුණු වෙලා බොහෝ සිත්

උපදිලා මහා කර්ම ගොඩක් සකස්වෙනවා. ඒකට හේතුව මොකක් ද? ඔහුගේ සන්තානයේ දී අප්‍රහීනව ද්වේශය නමැති ධර්මය බලවත්ව යෙදිලා තිබිලා තියෙනවා. හුරුවක් තිබිලා තියෙනවා. මෙන්න මේ හුරුව නිසා ඔහුට අර නැවත නැවත සිත් උපදින්න හේතුවෙනවා. එතකොට අන්න ඒ වාගේ ප්‍රකුතෝපනිශ්‍රය ප්‍රත්‍යය කියන එක අන්න ඒ විදියට අපි තේරුම්ගන්න ඕනේ.

දැන් අපි කියමුකො අවිද්‍යාව කියන කාරණාව කෙනෙක් දැක්ක නිසා ම මේ අවිද්‍යාව තිබුණොත් මේ සංසාරයේ ඇවිදින්න වෙනවා නේ ද. මේ අවිද්‍යාව නිසා නේ ද මේ අනන්ත ජාති සංසාරයේ අපි ගියේ කියලා මේ අවිද්‍යාව තමන් තුළ තියෙනවා නේ ද කියලා දැකලා, ඒ අවිද්‍යාව අරමුණු කර කර නැවත නැවත ඔහු විදර්ශනා ඥානයන්, ධර්මශ්‍රවණයන්, ධර්ම සාකච්ඡාවන් කරනවා. ඇයි අපි ධර්ම සාකච්ඡාවන් කරන්නේ? නුවණ වැඩෙනවා. මෝඩකම ගෙවෙනවා. ඇයි ධර්මයේ අපි මේ ප්‍රායෝගික භාවනා කරන්නේ? අපි තුළ අවිද්‍යාව තියෙන නිසා නේ ද? දැන් බලන්න අවිද්‍යාව කියන කාරණාව නො තිබුණා නම්, අපි භාවනා කරනවා ද? අපි ධර්ම සාකච්ඡා කරනවා ද? ඔබ මේ ධර්ම මණ්ඩපයට ඇවිල්ලා මේ විදියට ඇයි මේ ශ්‍රවණය කරගෙන ඉන්නේ? 'මා තුළ අප්‍රහීනව අවිද්‍යාව තියෙනවා නේ ද?' ඔබ තුළ අවිද්‍යාව නො තිබුණා නම් මෙතෙන්ට ඔබ එනවා ද? දැන් ඔබට අවිද්‍යාව ප්‍රත්‍යවෙලා නැද්ද කුසල්වලට? එතකොට එහෙම වීමක් නැද්ද දැන්? ඔබට මේ සිද්ධාන්තය ප්‍රායෝගිකව තේරෙන්නට ඕන. හැබැයි දැන් මෙතෙන්ට ධර්මශ්‍රවණය කරන්නට ඔබ ආවාට, මේ අවස්ථාවේ ඔබගේ හිතේ අවිද්‍යාව නැහැ. ධර්මශ්‍රවණය කිරීම නමැති කුසල් තමයි ඔබගේ සිතේ දැන් මේ ඉපදිලා තියෙන්නේ. ඔබ ධර්මශ්‍රවණය කරන්න එන්නේ නැහැ ඔබ තුළ අවිද්‍යාව කියන කාරණාව නො තිබුණා නම්. තියෙනබව දන්න නිසා තමයි ඔබ මෙතෙන්ට ආවේ. සතිපතා මෙතෙන්ට එන්නේ. අත නො

හැර භාවනාව සිද්ධ කරන්නේ ඇයි ඒ? අවිද්‍යාව කියන කාරණාව තමන්ගේ සන්තානගතව තියෙන නිසා ම යි. දැන් බලන්න මේ ප්‍රත්‍ය ශක්තිය කියන එක. අන්න ඔය විදියට තමයි අපි තේරුම්ගන්නට ඕන. ඒක ඔබ තේරුම් ගත්තොතින් පින කරන්න අවිද්‍යාව ප්‍රත්‍යවෙන්නේ නොයෙ දී යි. හිතේ නො යෙදීත් අවිද්‍යාව ප්‍රත්‍යවෙනවා කියන කාරණාව හොඳට විමසලා බලන්න. ඔබට තේරුම්ගන්න පුළුවන්.

දැන් කෙනෙක් දන් දෙනවා. දන් දෙන්නේ ඇයි? දුගතියේ උපදින්න තියෙන බයේ යි. බය නිසා යි. අප තුළ මෝඩකම නිසා අකුසල කර්ම සකස්වෙලා තියෙන්න පුළුවන්. ඒ නිසා අපි පින්කරනවා. ඇයි පින් කරන්නේ? දැන් පින් කරන කොට ඒ හිතේ යෙදිලා නැහැ. නමුත් ඔබ තුළ ඒ විදියේ අවිද්‍යාව යෙදිලා කර්ම සකස්වෙලා තියෙන නිසා යි ඒකට බයේ ඔබ පින් කරන්නේ.

අන්න ඒ නිසා දැන් බලන්න මේ දන් දෙන්න අවිද්‍යාව ප්‍රත්‍යවෙලා නැද්ද? සිල් රකින්න අවිද්‍යාව ප්‍රත්‍යවෙලා නැද්ද? ඇයි ඔබ මේ හැමදාම මේ පෝයට ගිහිල්ලා සිල් රකින්නේ? තමන් මේ සිල් රැක්කේ නැතිනම් තමන්ගේ මේ මෝඩකම යෙදිලා තියෙන නිසා යි සිල් රකින්නේ. ඒ නිසා ඔබ තුළ අවිද්‍යාව නො තිබුණා නම් සිල් රකින්න අවශ්‍යවෙන්නේ නැහැ නේ. ඔබ සිල් රකින්න එන්නේ නැහැ නේ. අන්න ඒ නිසා මේ ප්‍රත්‍යභාවය කියන එක ඔබ තවත් නුවණින් ඇතුළට ගිහිල්ලා තේරුම්ගන්න. එතකොට ඔබට මනාව හොඳට තේරෙයි කොහොම ද මේ ප්‍රත්‍ය ශක්තිය ක්‍රියාත්මක වෙන්නේ කියන එක.

දැන් ඔබට මේ අභිධර්මය වැදගත් නැද්ද? අපේ මෝඩකම තේරුම්ගන්න වැදගත් නැද්ද? සමහර අය, 'අභිධර්මයෙන් වැඩක් නැහැ. ඒවා බුද්ධභාෂිතයක් නෙවෙයි. ඒවා මනුෂ්‍යයින්ට දේශනා කරේ නැහැ' කියනවා. මේ කතා කියන්නේ මේ කාරණා නො තේරන නිසා යි. දැන් ඔය අපට

අභිධර්මය දෙවියන්ට දේශනා කරා ද? මනුස්සයන්ට දේශනා කරා ද? ඒවා බුද්ධභාෂිතයක් නෙවෙයි ද? කියන කාරණාව ද වැදගත්? දැන් මේ අභිධර්මය තුළින් අපි විග්‍රහකරගන්නා කාරණාව අපට ප්‍රායෝගිකව ම ඔප්පුවෙලා පෙනෙනවා නම්, යමක් ඔප්පුවෙලා, පැහැදිළිකරලා දැනගන්න ඒ අභිධර්ම කොටස් හේතුවුණා නම්, මේවා අපි බැහැරකළයුතු ද?

අන්න ඒ නිසා මේකෙන් අපි ගතයුතු සාරයන් ගන්නකොට, අභිධර්මය කියලා  කියන්නේ නොවැටහෙන අප්‍රකට දේවල් විවරකරගන්න, ප්‍රකටකරගන්න, තියෙන වටිනා වූ ධර්ම කොට්ඨාශයක්. ඒවා ඇත්තට ම ඥානවන්තයන්ට විතරයි හැබැයි ඒ ගෝචරවෙන්නේ. අන්න ඒකයි. ඉතින් ඒ නිසා මම ඔබට මතක් කරේ, දුකට හේතුව තණ්හාව යි කියලා චතුරාර්‍ය්‍ය සත්‍යයේ පෙන්නනවා. ඒ වාගේ ම දුක් උපදින වැඩපිළිවෙල අවිද්‍යාව සංඛාර නිසා, විඤ්ඤාණ විඤ්ඤාණ නිසා නාම රූප ටිකක් පටිච්චසමුප්පාදයේ පෙන්නනවා. හැබැයි මේ ඔක්කෝගෙම පෙන්නන්නේ ධර්ම ටික විතර යි. ප්‍රත්‍යභාවයන් පෙන්නන්නේ නැහැ. ප්‍රත්‍යභාවයන් පෙන්නන්නේ ඔන්න ඔය සූවිසිප්‍රත්‍ය න්‍යායයන් යටතේ යි. ඒ නිසා මේක ඔබට වැදගත් මේකේ තව කොටස් කතාකරන්න තියෙනවා. අපි ඉදිරියට මේ පුඤ්ඤාභිසංඛාරයන් ඇතිවෙන ආකාරය. අපුඤ්ඤාභිසංඛාරයන් ඇතිවෙන ආකාරය පිළිබඳව අපි විග්‍රහකරගම්මු.

අද කතා කරේ අවිද්‍යාව කුසල්වලට ප්‍රත්‍යවෙන්නේ කොහොම ද, අලම්භන ප්‍රත්‍යයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා කියලා කතාකරා. ආලම්බන ප්‍රත්‍යය කියන්නේ මොකක් ද කියන එක අපි විග්‍රහකරගත්තා. උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය කියන්නේ මොකක් ද කතාකරා.

හැබැයිමේ දෙක ම ප්‍රත්‍ය ශක්ති දෙකක්. ඒ ප්‍රත්‍ය ශක්ති දෙක ම තියෙන්නේ අවිද්‍යාව කියන ධර්මය තුළ යි. අවිද්‍යාව නමැති ධර්මය තුළ මේ ආලම්බන ශක්තිය උපනිශ්‍රය ශක්තිය කියන

එක ප්‍රත්‍යවෙලා තමයි අපි තුළ පුණ්‍යාභිසංඛාර ඇතිවෙන්නේ. එතකොට ඒ උපනිශ්‍රයභාවය කියන එක කොටස් තුනකට බෙදාගත්තා. ඒක ඇතුළේ කොටස් තුණක් තියෙනවා කියලා. ඒ ශක්ති තුන අපි අනන්තර උපනිශ්‍රය, ආලම්බන උපනිශ්‍රය, ප්‍රකුතෝපනිශ්‍රය කියලා කතා කළා. ඔබ මේක නැවත ශ්‍රවණය කර කර, කර කර මේ ශක්තිභාවය තේරුම්ගන්න උත්සාහවත් වෙන්න.

සාකච්ඡාවට අපට පැය භාගයක් විතර තියෙනවා. ඉතින් ඒකට කාලය මදිවෙන නිසා මම මෙතැනින් මේ සංඛාර පදය විග්‍රහ කරන එක නතර කරනවා. අපට මේකේ තියෙන ගැටලු ප්‍රශ්න වලට ඉඩ අවකාශයක් දීලා සංඛාර පදය අපට විග්‍රහකරගත යුතු තැන් කොටස් ටිකක් තියෙනවා. ඊළඟ සැරෙත් අපි මේ මාතෘකාව ම ගැඹුරින් කතාකරගන්න ඒකේ ප්‍රත්‍ය ශක්තීන් අකුසලයට යෙදෙන්නේ කොහොම ද, ඊට පස්සේ තවත් මේ ආනෙඤ්ජාභී, අරූපාවචර සංඛාරයට මේක යෙදෙන්නේ කොහොම ද කියන එක අපි විග්‍රහකරගම්මු. හොඳයි තෙරුවන් සරණයි හැමදෙනාට ම.

## සාකච්ඡාව

**ප්‍රශ්නයක්:** ස්වාමීන් වහන්ස, සංස්කාර ගැන කතා කරන කොට මට මතක විදියට සංඛත සංඛාර, අභිසංස්කරණ සංස්කාර, අභිසංඛත සංස්කාර වාගේ කොටස් තුනකට බෙදනවා නේ අතන. මම අහලා තියෙන විදියට අභිසංස්කරණ සංස්කාරයෙන් නේද අපට නැතිකරන්න පුළුවන්. අන්න ඒ ගැන පොඩ්ඩක් විස්තරයක් කරනවානම් ස්වාමීන් වහන්ස. අර සංඛත සංඛාර යි, අභිසංඛත සංඛාර යි දෙක ම අපට වලක්වන්න බැහැ. අභිසංස්කරණ සංස්කාර තමයි අපට වළක්වන්න පුළුවන් වාගේ දෙයක් තමයි මට වැටැහෙන්නේ. ස්වාමීන් වහන්ස ඒ ගැන පොඩි විස්තරයක් කරන්න.

**<u>පිළිතුර:</u>**හොඳයි ඒ ඇහුවේ මේ සංඛාර පදය විවිධ අර්ථවල යෙදෙනවා. ඒ සංඛත සංඛාර, අභිසංඛත සංඛාර, අභිසංකරණ සංඛාර, කියලා එතැන දී අපි නැතිකරන්න පුළුවන් වෙන්නේ අභිසංකරණ සංඛාරයි නේ ද කියන කාරණාව තමයි එතුමා ප්‍රශ්නයක් වශයෙන් ඇහුවේ. ඇත්තට ම ඒ ප්‍රශ්නය අපි තව ටිකක් නිවැරැදි කරොත් ඒ ප්‍රශ්නය, අපි නැතිකළ**<u>යුත්තේ</u>**, අභිසංස්කරණ සංඛාර යි කියන එක යි මේ අපි තේරුම්ගන්න ඕන ඒක යි. මොකද, සංඛත සංඛාර අභිසංඛත සංඛාර කියන එව්වා, ඒවා අපි නැතිකරන්න හැදුවත් නැතත්, ඒවා ප්‍රත්‍යය නැතිවෙනකොට නැතිවෙනවා. සංඛත ධර්මයන්ගේ ස්වභාවය තමයි හේතු ධර්මයක් ඇති කල්හි ඵල ධර්මයෝ උපදිනවා. ඒකයි අපට හේතු තියෙනවා නම් ඵල උපදිනවා කියන එක නැතිකරන්න පුළුවන්කමක් නැහැ. ඵලයට මොකුත් කරන්න බැහැ. නමුත් මාර්ගයකින් කරන්නේ, මාර්ග භාවනාවකින් කරන්නේ ඇත්තට ම මේ අභිසංස්කරණ සංඛාර නැතිකරන එක තමයි. පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආණෙඤ්ජාභි කියන මේ ත්‍රිවිධ සංඛාරයන්, ඒක නේ ***පුඤ්ඤ පාප පහීනස්ස*** කියලා මාර්ගයෙන් කරන්නේ පින් පවු සහමුලින්ම නැතිකරන එකයි. කුසල් අකුසල් නිසා තමයි නැවත සසර උපදින්න හේතුවෙන්නේ. නැවත මේ ස්කන්ධ පටිපාටිය හදන්නේ මේ පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආණෙඤ්ජාභි කියන මේ අභිසංස්කරණ සංඛාර නිසා යි. එතකොට අන්න ඒ නිසා අපි මාර්ගයකින් නැතිකරන්නේ, ඒවා මාර්ගයකින් නැතිකළයුත්තේ ඒ දේවල්. ඒ නිසා යි අපට මාර්ග භාවනාවක් කියලා තියෙන්නේ බුදුරජාණන් වහන්සේ.

මාර්ග භාවනාවෙන් වුනේ මෙන්න මේක යි. එතකොට එහෙම කියලා අපි කියමුකො අපුඤ්ඤාභිසංඛාරයෙන් අකුසලයන් නැතිකරනවා කියලා මාර්ග යෙදුනේ අකුසල් සිහිකර කර සිහි කර කර එහෙම ගෙවනවා නෙවෙයි. ඒ නැතිකරන ක්‍රමයක් තියෙනවා. මාර්ගය අපි විදර්ශනා කරන කොට අපිට අකුසලය උපදින්නේවත් නෑ හිතේ. බොහෝ සෙයින් යටපත්වෙලා

තියෙන්නේ. නමුත් අකුසලය නැතිකිරීමක් වෙන්නේ නැද්ද? වෙනවා. එතකොට එහෙනම් ඒ වෙන්නේ කොහොම ද? මාර්ගයෙන් කරන්නේ අරමුණේ ඇත්ත පෙන්වීම යි. සත්‍ය පෙන්වීම නිසා සත්‍ය දැකීමත් එක්ක ඔහුට මිත්‍යාදිට්ඨිය, වැරැදි දැකීම නිසා යම් අකුසල ධර්මයන් ටිකක් ගොඩනැගිලා තිබුනා නම් ගොඩනැගෙමින් පවතිනවා ඒ ධර්මයන්ට නූපදීම නිරුද්ධ වීමේ හැකියාව, ඇත්ත අවබෝධ කර ගැනීමෙන් සිද්ධවෙනවා. ඒක ධර්මතාවක් වශයෙන් සිද්ධවෙන එකක්. ඒ නිසා මාර්ගයෙන් කරන්නේ අකුසලය නැතිකරනවා කියලා අකුසල් සිහි කර කර නැතිකරන එක නෙවෙයි. මාර්ගයෙන් කරන්නේ සත්‍ය අවබෝධයක්. සම්මා දිට්ඨි, ඇත්ත දැකීම තමයි මාර්ගයෙන් පෙන්නන්නේ. බොරුව තේරුම් අරගෙන ඇත්ත පෙන්න පෙන්නා අවබෝධ වෙන්න වෙන්න වෙන්න වෙන්න බොරුව කියන එකට එන්න හේතු නැහැ. ප්‍රත්‍ය නැහැ. ඒක තමයි වෙන්නේ.

ඒ නිසා පින් හෝ කුසල් හෝ අකුසල් - මේ හැම දේක ම සිද්ධවෙන්නේ අවිද්‍යාව නිසා, එතකොට පින් හෝ අකුසල් හෝ මේ කුමණ ආකාරයේ දෙයක් සිද්ධවුණත් අපට සසර උපදින්න වෙනවා. ඒ නිසා අපි මේ දෙකේ ම ප්‍රහාණය සිද්ධකළයුතු යි. නමුත් අපි අකුසලය කියන එක දුගතියට හේතු වෙනවා. කුසලය නිවන් දකිනකම් අපට සැප විපාක ගෙනැත් දෙනවා. ඒ නිසා අපට මේ කුසලය කියන එක නිවන් දකිනකම් උපකාර වෙනවා. ඒ නිසා යි අපි කුසල් කළයුත්තේ. ඒ නිසා මේ ගොඩාක් අයගේ අදහස් තියෙනවා නේ මේ නිවන් දකින කෙනා කුසල් කරන්නත් හොඳ නැහැ නේ. ඒක සම්පූර්ණ ම මිත්‍යාවක්. ඒක සම්පූර්ණම ඔහු අර මේ ගොඩවෙන්න ඉස්සරවෙලා ඉණිමග පෙරළාගන්නවා වාගේ කතාවක්.

ඉතින් ඒ නිසා මේ කුසලයේ ශක්තිය අවශ්‍යවෙන්නේ අකුසලය තියෙන තාක් කල් පමණ යි. ඒ නිසා මේ හැම

කුසලයකින් ම අකුසල ධර්මයක් යටපත්වීම හෝ නිරුද්ධවීම වෙනවා. අපි කෙනෙක් දන් දෙනවා. දන් දීම තුළ වෙන්නේ ලෝභයට පහර ගැසීමක්. එහෙම මිසක් මේ සසර යෑමක් කියන එක නෙවෙයි. ඒ නිසා මේ අකුසල ශක්තිය තියෙන තාක් කල් තමයි අපි සසර යන්නේ. ඉතින් ඒ නිසා අපි කුසල් උපදවාගෙන අකුසල ශක්තිය යටපත්කරගෙන, යටපත්කරගෙන, යම් කලෙක මාර්ග භාවනාවක් කරළා මේ අකුසලය කියන එක, අනුසයෙන් දක්වා ම ප්‍රහීණ කරන තැනකට මාර්ග භාවනා කරායින් පස්සේ අකුසලය ඉබේට ම නිරුද්ධවෙලා යනවා. ඒක නැතිකරන්න අපි දඟලන්න අවශ්‍ය නැහැ. කුසලය නැතිකරන්න අවශ්‍ය නැහැ. කුසලය තියෙන්නේ අකුසලයට විරුද්ධව යි. ඒ නිසා අකුසලය නැතිනම් කුසලය උපදින්නේ නැහැ. දැන් අපි අර මුලින් කතා කරේ - කුසලය කියන්නේ මොකක් ද? පාණාතිපාතා වේරමණී. අදින්නාදානා වේරමණී, කුසල යි. ඇයි සතුන් මැරීම කියන ධර්මතාවයක් තියෙන නිසා ඒකට විරුද්ධව, ඒකෙන් වෙන්වීම කියන එක ධර්මතාවයක් යෙදෙනවා. ඒ නිසා මාර්ගයෙන් කරන්නේ කුසල් නැතිකිරිම නෙවෙයි, අකුසල ශක්තීන් නැතිකිරිම යි. අකුසලය නැතිවෙන කොට ම කුසලය නූපදීම, නිරුද්ධවීමට, යනවා. ඉතින් ඒ නිසා අර අහපු ප්‍රශ්නයේ දී මම මේකට අමතර කාරණාවක් එකතුකරගත්තේ. ඒකේ දී අපි තේරුම්ගන්න ඕනේ ඇත්තට මේ මාර්ග භාවනාවකින් කරන්නේ ම අන්න අර කියන අභිසංස්කරණ සංස්කාර ටික නැතිකරන්න යි. නැතිකරන්නේ කොහොම ද? මාර්ගයකින් ඇත්තක් දකින්න සලස්වලා ඒ නිසා අර ටික නැතිවෙනවා. එහෙම තමයි සිද්ධවෙන්නේ. තෙරුවන් සරණ යි.

----------

<u>**ප්‍රශ්නයක්:**</u> පුණ්‍යාභිසංස්කාර ඇතිවෙන්න අවිද්‍යාව ආලම්භන ප්‍රත්‍යයෙන් සහ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙද්දී

ස්වාමීන් වහන්ස, යම් ධර්මයක් පිළිබඳව අපි ආත්මීය ස්වභාවයක් අරමුණුකරගන්න නිසා, දැන් ඒ ආත්මීය ස්වභාවය මොහොතකට හරි නැතිවුණොත්, ඒ කියන්නේ අනාත්ම ලක්ෂණයක් දැක්කොත් ඒ සංස්කාරවලට මොකද වෙන්නේ ස්වාමීන් වහන්ස?

**පිළිතුර:** හොඳයි හොඳ ප්‍රශ්නයක්. එතකොට සත්ත්ව-පුද්ගල අදහස කියලා අපි ඔක්කෝට ම පොදුවේ කිව්වොත්, මම-මගේ කියන මේ අදහසට අපි කියනවා සත්ත්ව-පුද්ගල අදහස කියලා. මේක පදනම්වෙලා තමයි අපට පින්-පව් දෙක ම කෙරෙන්නේ. එතකොට කෙනෙක්ව දන් දෙන්නෙත් පුද්ගලභාවයෙන් යුක්තව යි. ඒ වාගේ ම සතුන් මරණ, බොරු කීම් ආදිය කරන්නෙත් පුද්ගලභාවයෙන් යුතුව යි. සක්කාය දිට්ඨිය කියන එක මේ ස්වර්ගීය ආවරණය කරන්නේ නැහැ. මාර්ගීය විතර යි ආවරණය කරන්නේ. එතකොට ස්වර්ගීය කීවාට දිව්‍යලෝකයේ උපදින්න සක්කාය දිට්ඨිය අවශ්‍ය කරන්නේ නැහැ. එයාගේ සක්කායදිට්ඨියේ බලවත්ම කම තමයි අරූපාවචර, රූපාවචර ධ්‍යාන කියන ටික. ඒවා ඒ තරම් බලවත්ව යෙදිලා තියෙනවා ඒ සක්කායදිට්ඨිය කියන එක යෙදෙන්න පුළුවන්කම තියෙනවා. සක්කායදිට්ඨිය වරදවා තේරුම්ගන්න එපා. ඒක උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යවෙලා තියෙනවා. රූපාවචර සිත්තුල මේ දිට්ඨිය කියන චෛතසිකය යෙදිලා තියෙනවා කියන එක නෙවෙයි කිව්වේ. එතකොට ඒ මහත්මිය අහපු ප්‍රශ්නයේ දී දැන් අපි විදර්ශනා ඥාන ඇතිකරගන්නකොට අපි ආත්ම දෘෂ්ඨිය නැතිකරගන්න උත්සාහවත් වෙනවා. ආත්මදෘෂ්ඨිය නැතිකරන්න උපද්දවන සිතුත් කුසල් සිත් තමයි. ඒවා තුළත් මාන අනුශය නැතුවා නෙවෙයි. ඒ වාගේත් පුද්ගලභාවය තිබුණා. නමුත් මේ පුද්ගලභාවය උපකාරකරගෙන ඒ උපකාරයෙන් ම අර සත්ත්ව-පුද්ගලභාවයෙන් ඇතිවෙන ඕලාරික සංස්කාරයන් නැතිකිරීමයි කරන්නේ. එතකොට කර්ම ගෙවනවා කියලා නේ අපි සිද්ධකරන්නේ. එතකොට අනාත්මයට බලන්න බලන්න,

ආත්ම වශයෙන් ඇතිවෙලා හටගත්තු කුසල් හා අකුසල්, මේවා ටික ටික ගෙවීමට යනවා.

ඒ නිසා අපි විදර්ශනා කරන කොට විදර්ශනාව පටන්ගැනීමේ ඉඳන්, මාර්ග සිත දක්වා ම සිත්ගත්තොත්, මේ සිත් ගෝත්‍රභූ සිත හැර මාර්ග සිත දක්වා මේ ප්‍රබල විදර්ශනා ඥානයක් ගත්තොත්, මේ ඔක්කෝම කාමාවචර ලෞකික, ඥානසම්ප්‍රයුක්ත කුසල් සිත්. ඒ එකක්වත් ලෝකොත්තර සිත් නෙවෙයි. ලොකෝත්තර සිතේ අරමුණ නිර්වාණය යි. අසංඛතය යි. මේ අපි ලෞකික විදර්ශනා ඥාන ඔක්කෝම සංඛත ධර්මයන් අරමුණුවෙලා, ඒවාගේ අනිත්‍ය බව, දුක් බව, අනාත්ම බව අරමුණු කරමින් ත්‍රිලක්‍ෂණය වඩමින් යන්නේ. ඒ නිසා මේ සංඛත ධර්ම හැම එකක් ම කුසල්. හැබැයි ඒ කුසලයෙන් කරළා තියෙන්නේ කර්මක්‍ෂය කිරීම කියන එක තමයි ඒ සිද්ධවෙලා තියෙන්නේ. කර්ම ගෙවන කුසල්. කුසල් තියෙනවා කර්ම නැවැත නැවැත සකස්වෙන කුසල් තියෙනවා. කර්ම ගෙවලා දාන්න පුළුවන් කුසල් ද තියෙනවා. ඒකයි මම මේ කුසලයේ ආකාර ගොඩාක් තියෙනවා. අර අපි මුලින් කතා කරේ: එක ම වස්ත්‍රය තව කෙනෙකුට ලෝභය ඇතිකරන්නත් හේතුවෙනවා. තව කෙනෙකුට තරහා ඇතිකරන්නත් හේතු වෙනවා. තව කෙනෙකුගේ රූප ශෝභාව ඇතිකරන්නත්, එහෙම නැතිනම් අපි කියමුකො, ලස්සනට බුදුරජාණන් වහන්සේට චීවරයක් පොරවලා තිබුණා ම එක කෙනෙකුගේ පැහැදීම ඇතිවෙන්න හේතුවෙනවා.

එතකොට එක ම දේ විවිධාකාරයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන් වගේ මේ කුසලය මේ ඥාණසම්ප්‍රයුක්ත කාමාවචර කුසලයක් නිසා කෙනෙක් ඒකේ බලවත්ව යෙදිලා ආත්ම දෘෂ්ඨිය ඇතිකරගෙන කුසල් කරනවා. දිව්‍ය ලෝකයේ උපදින්න, බ්‍රහ්ම ලෝකයේ උපදින්න. හැබැයි සසර යන කුසල් ඒවා. කෙනෙක් ඒ මමත්වයේ ම පිහිටලා, ඒ මමත්වය නැතිකරන්න උත්සාහවත් වෙනවා. එතකොට ඒ කුසලය උපකාරවෙලා

තියෙන්නේ කර්මය ඇතිකරන්න නෙවෙයි, නැතිකිරීම සඳහා යි. ඉතින් ඒ නිසා දැන් ඒ අපට ආත්ම දෘෂ්ඨිය නැතිකිරීම වශයෙන් උපදින සිත් ගත්තහම ඒවාත් කුසල් සිත් ම යි. ඒ වාගේ කර්ම නැතුවා නෙවෙයි. කර්ම ශක්තියක් තියෙනවා. එයා මාර්ග ඵලයක් ලැබුවොත් විදර්ශනා කර කර හිටියා කියලා උපදින්නේ නැතුව තියෙන්නේ නැහැ නේ. උපදිනවා. සුගතියක උපදිනවා. හැබැයි ඒකෙන් වෙලා තියෙන්නේ මේ තාක් වෙච්ච අකුශල ශක්තීන් තමයි නැතිකරගෙන, නැතිකරගෙන යන්නේ. ආත්ම දෘෂ්ඨියෙන් ගත්තු අකුශල ශක්ති. ඒ නිසා කර්ම ශක්තිය ටික ටික ගෙවෙන එක තමයි ඒ ආත්ම දෘෂ්ඨිය නැතිකිරීම වශයෙන් අපි විදර්ශනාවලින් කරලා තියෙන්නේ. ඒක නිසා අපි කියන්නේ අර කර්මක්ෂයගාමිනී ඒකට කියන්නේ කර්මක්ෂයකරන කර්ම ටිකක් ඇතිකරගන්නවා. ඒ එක ම කුසලයෙන් කර්මය වැඩිකරන මනසිකාරයෙනුත් වෙන්න පුළුවන්. කර්මය දුර්වල කරලා ගෙවන මනසිකාරයෙන් වෙන්නත් පුළුවන්. විදර්ශනා ඥාන කියලා කියන්නේ ටික ටික කරන එකයි.

උදාහරණයක් වශයෙන්: සෝවාන් පුද්ගලයාගේ අවිද්‍යාව යම් ප්‍රමාණයකින් නැතිවෙලා තියෙනවා. ඔහුට ලෝභය උපදිනවා. ඔහුට ද්වේශය උපදිනවා.ඔහුට හැබැයි කවදාවත් අපායගාමී ද්වේශයක් උපදින්නේ නැහැ. සතෙක් මරන ද්වේශයක් උපදින්නේ නැහැ. ඇයි? එයාගේ ඒ ශක්තිය නැතිකරා. හැබැයි එයාට ද්වේශය උපදින්න පුළුවන්. හැබැයි ඔහු ඒ ද්වේශයෙන් කොටසක් සංසිඳවලා තියෙන්නේ. හැබැයි මාර්ග ඵලයක් නො ලබාපු කෙනා, විදර්ශනාවක් නො කරපු කෙනාට ඒ ද්වේශය දඬු මුගුරු අරගෙන පොලු අරගෙන, මරන්න ගහන තත්ත්වයට ඒක ක්‍රියාත්මක වෙනවා. ඉතින් අන්න ඒ නිසා මේ ශක්තිය තමයි විදර්ශනා ඥාන තුළින් නැතිකරන්නේ.

---------

**ප්‍රශ්නයක්:-** අවසරයි ස්වාමීන් වහන්ස අපි ධර්මයේ අහලා තියෙනවා ආයු සංස්කාර ගැන. ආයු සංස්කාරය බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට තුන් මාසයකට පෙර අතහැරියා කියලා තියනවා. මේ ආයු සංස්කාරයේ ක්‍රියාකාරිත්වය කොහොම ද, ඒ ආයු සංස්කාරය අයත්වන්නේ කුමණ සංස්කාර වර්ගයකට ද (අපැහැදිළි යි.) කියලා අහන්න කැමැති යි.

**පිළිතුර:-** ප්‍රශ්නය අපැහැදිලි වෙච්චි නිසා එතුමාගේ ප්‍රශ්නය මම ආයෙ කියනවා. එතුමා ප්‍රශ්නය වශයෙන් ඇහුවේ ආයුසංස්කාරය කියලා කොටසක් ධර්මයේ සඳහන්වෙනවා. ආයුසංස්කාර අත්හැරීම කියලා කොටසක් මේ ධර්මයේ කතාවෙනවා. ඒ ආයුසංස්කාර කියලා කියන්නේ අපි මේ කතාකරපු සංඛාරයන්ගෙන් මොන කොටසට ද අයිතිවෙන්නේ, එහෙම නැතිනම් එතැන යෙදෙන ධර්මය මොන වාගේ ධර්මයක් ද ආයුසංඛාරය කියලා කියන්නේ?

හොඳ ප්‍රශ්නයක් ඒක. අපි තේරුම් ගතයුතු දෙයක්. එතැන දී මේ ආයුසංඛාර - අන්න එතැනත් සංඛාරයක්. එතකොට ඒ ආයුසංඛාර කියලා කියන්නේ අපි මේ කතාකරන පුඤ්ඤාභිසංඛාර හෝ අපුඤ්ඤාභිසංඛාර හෝ ආනෙඤ්ජාභිසංඛාර නෙවෙයි. ආයු සංඛාර කියන එක කර්මජ රූපයක්. ඒක කර්ම ශක්තියක් තියෙන එකක්. රූපයක් කියලා කිව්වේ මම ඒ අර්ථයෙන්. පෙර අපි කරපු කර්මයට අනුරූපව තමයි අපේ ආයුෂ කියන එක තීරණය වෙන්නේ. එතකොට කෙනෙක්ගේ ආයුෂ අවුරුදු පනහක් වෙනවා. හැටක් වෙනවා. අසූවක් වෙනවා. එකසිය විස්සක් වෙනවා. මේ ආයුෂ කියන එක තීරණය වෙන්නේ අපේ ප්‍රතිසන්ධියත් එක්ක ලැබිච්චි ඒ චිත්තය අනුව යි. ප්‍රතිසන්ධියට අපට හේතුවුණේ කර්මයක්. පෙර ජිවිතයේ කර්මයක්. පෙර ජිවිතයේ කර්මයේ තිබුණු පුණ්‍ය ශක්තිය, අපි මනුස්සයෙක් වුණා නම් සමහරවිට ඒ

අකුසලයේ ශක්තිය නිසා එයා බුද්ධාන්තර ගණනක් නොමැරී දුක් විඳිනවා අපාය තුළ.

නිරය ගත්තහම ආනන්තරිය පාප කර්මයක ශක්තිය කොයි තරම් ද කියනවා ද. ජීවිතේන්ද්‍රිය රූපය, එහෙම නැතිනම් ආයුෂ කියන එක මහා කල්පයක් ශක්තිය තියෙනවා නො නැසී පවතින්න. එතකොට එහෙනම් මේ කර්මයෙන් උපද්දවාපු ශක්තිය තමයි ආයුෂ කියලා කියන්නේ. ආයුෂ කියලා කියන්නේ වෙන මොනවාවත් නෙවෙයි, ජීවිතෙන්ද්‍රිය රූපය යි. ජීවිතෙන්ද්‍රිය රූපය කොටස් දෙකකට බෙදනවා **නාම ජීවිතෙන්ද්‍රිය හා රූප ජීවිතෙන්ද්‍රිය** කියලා. එහෙනම් මේ ආයුෂ කියන එක කතා කරන්නේ සත්ත්ව සන්තානයේ පමණයි. මේ ජීවිතෙන්ද්‍රිය රූපය තියෙන්නේ සත්ත්ව සන්තානයක පමණ යි. ගහකටත් ආයුෂ තියෙනවා. ඒක ඍතුජ රූපයන්ගේ බීජයන්ගේ තියෙන නියාමයක්. ඒක වෙන කතාවක්. නමුත් මෙතැන ආයුෂ කියලා කියන්නේ, දැන් ***ආයු උස්මාච විඤ්ඤාණං, යදා කායං ජහන්තිමං; අපවිද්ධො තදා සෙති, නිරත්ථංව කලිඞ්ගරං***(*රූප සංගහ පරමත්ථදීපනී 202 බලන්න.)*කියලා මේ ශරීරයේ ආයුෂ ත්, උනුසුම ත්, යම් කලෙක මේ කයෙන් බැහැර වුණා ද, එදාට මේ කය දරලීයක් වගේ බිමට වැටෙනවා කියනවා. දර කඩක් වාගේ බිමට වැටෙනවා. එදාට මේ කය බිමට වැටිලා ඔහු මරණයට පත්වෙනවා කියලා කියනවා.

ඒ ආයුෂ කියලා මෙතැන සටහන් කරේ කර්මයෙන් හටගත්තු ජීවිතෙන්ද්‍රිය රූපය යි. රූපයටත් ආවුසක් තියෙනවා. නාමයටත් ආවුසක් තියෙනවා. මෙතැන රූප ජීවිතෙන්ද්‍රිය හා නාම ජීවිතෙන්ද්‍රිය කියන මේ දෙක තමයි ඔතැන **ආවුසය** කියලා කියන්නේ. එතකොට ඒ **ජීවිතෙන්ද්‍රිය රූපය කියලා කියන්නේ රූපය ජීවත් කරවන ශක්තිය යි.** නාම ජීවිතෙන්ද්‍රිය කියලා කියන්නේ නැවත නැවත මේ නාම පරම්පරාව නො සිඳී පවත්වන ශක්තිය යි. ඒ කියන්නේ මේ මෙවා නො සිඳී

පවතිනවා කියලා කියන්නේ ඒ හටගත්ත නාම ධර්මයෝ එක දිගට තියෙනවා කියන එක නෙවෙයි. මෙතැන ජීවිතෙන්ද්‍රිය ශක්තිය කියලා කියන්නේ හටගත්ත නාමරූපය නිරුද්ධවුණාට නැවත නැවත උපද්දව උපද්දවා පවත්වනවා. මෙන්න මේ ශක්තිය තමයි ජීවිතෙන්ද්‍රිය රූපය කියලා කියන්නේ.

ජීවිතෙන්ද්‍රිය රූපයෙන් කරන කෘත්‍යය තමයි තමාගේ උපකාරත්වයෙන් තවත් නාමධර්මයක් උපැද්දවීම හා පැවැත්වීම කියන කාරණාව. රූපයට ආයුෂක් තීරණය වෙන්නේ ජීවිතෙන්ද්‍රිය රූපය නිසා යි. එතකොට ඒ විදියට ඒ ජීවිතෙන්ද්‍රිය රූපයේ ශක්තිය යි ආයුෂ කියලා කිව්වේ. ඒ ආයුෂ කෙන කෙනාගේ විවිධයි. දැන් බුදුරජාණන් වහන්සේගේ ආයුෂ ගත්තොත්, මහා කල්පයක්. අසංඛ්‍ය කල්පයක්. කල්ප අසංඛ්‍යයක්.දැන් සමහර කාලවල ඔබ අහලා ඇති මනුෂ්‍යයන්ගේ ජීවිත අසංඛ්‍ය දක්වා වැඩිවෙනවා. ආයුෂ අවුරුදුවලින් කියන්න බැහැ මෙච්චර යි කියලා. ඒ තරම් ආයුෂ තියෙන කාල තියෙනවා. දැන් මහාමන්දධාතු රජ්ජුරුවෝ වාගේ ගත්තහම ඒ වගේයි. මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ආයුෂ ගත්තහම අපි අහලා තියෙන්නේ අසූදාහක් ආයුෂ තියෙනවා කියලා යි. ඒ තරම් එහෙම ආයුෂ කියන එක, ගෞතම බුදුරජාණන් වහන්සේගේ ආයුෂත්, ප්‍රතිසන්ධියෙන් දෙන ඒ ශක්තිය ඒ තරම් අති දීර්ඝ කාලයක් විපාක දෙන්න පුළුවන්.

නමුත් ආයුෂය කියන එකේ කල්පය දැන් ඒ ආයුෂ කල්පය කියලා බෙදනවා. නමුත් ඒ ජීවත්වන පරිසරය තුළ එදාට පවතින්නේ මනුෂ්‍යයින්ගේ ආයුෂ අවුරුදු සාමාන්‍යයෙන් මෙච්චරයි ද, ඒකට අනුගතවෙනවා. දැන් බුදුරජාණන් වහන්සේ උපදින කොට සාමාන්‍ය මනුෂ්‍යයින්ගේ ආයුෂ අවුරුදු එකසිය විස්සක්, එකසියපණහක් වාගේ කාලයක්. ප්‍රතිසන්ධි සිතේ අර තරම් ශක්තිය තිබුණත් මෙතැන දැන්

පවතින කාලයට ඒක තීරණය වෙලා පිරිනිවන් පාන්න වෙනවා. ඒ බුදු-පසේබුදු-මහරහතන්වහන්සේලාට හැකියාවක් තියෙනවා.

ආයුසංස්කාරය අත්හරිනවා කියලා කියන්නේ අධිෂ්ඨාන කරළා මෙන්න මේ ජීවිතින්‍ද්‍රිය රූපයේ තියෙන විපාකදීමේ ශක්තිය අත්හැරලා දාන්න පුළුවන්කම තියෙනවා. ඒක සාමාන්‍ය කෙනෙකුට කරන්න පුළුවන්කමක් නැහැ. සාමාන්‍ය පෘතග්ජනයන්ට ඒක කරන්න පුළුවන්කමක් නැහැ. බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත්හරිනවා කියලා කියන්නේ, අපි කියමුකෝ, තව අවුරුදු තිහක් ජීවත්වෙන්න ශක්තියක් තමන්ගේ ආයුෂ තුළ තියෙනවා නම්, උන්වහන්සේ අධිෂ්ඨාන කරළා, තව මේක අපි කියමු තව සති දෙකකින්. සති දෙකකින් මේ ආයු සංස්කාරය නිරුද්ධවෙලා යන්නේ කියලා අධිෂ්ඨාන කරගන්න පුළුවන්. ඒක තමයි බුදු-පසේබුදු-මහරහතන්වහන්සේලා ආයු සංස්කාරය අත්හරිනවා කියලා සිද්ධකරන්නේ. එතකොට ඒ ආයුෂ ඒ සංඛාරය කියලා කියන්නේ අර පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි ආදී ඒ සංස්කාරයක් නෙවෙයි, එතැන සංඛාර කියලා කිව්වේ ජීවිතෙන්‍ද්‍රිය රූපයයි, ධර්මය වශයෙන් ගත්තොත්. ඒක පෙර කර්මයට අනුරූපව ලැබිච්චි විපාකයක් වශයෙන් තියෙන එකක් තමයි ඒ කතා කරේ. තෙරුවන් සරණයි.

----------

**ප්‍රශ්නයක්:**- ස්වාමීන් වහන්ස මේ අද ඔබවහවන්සේ විස්තර කර විදියට සන්ධිවලට කඩලා බෙදන විස්තරේ සංයුක්ත නිකායේ බාලපණ්ඩිත සූත්‍රයේ ඒ සූත්‍රයේ ඒ විදියට කඩන්න පුළුවන් නේද කියලා හිතුණා. ඒක පොඩ්ඩක් පැහැදිළි කරළා දෙන්න. අනික් එක ස්වාමීන් වහන්ස අර මධුපිණ්ඩික සූත්‍රයේ දී අන්තිම හරියේ අර කියනවා නේ ඇස ඇතිකල්හි රූපය ඇතිකල්හි කියන විස්තරය කියලා කිව්වේ. ඊට පස්සේ ඇස නැතිකල්හි රූපය නැතිකල්හි කියලා

විස්තරයක්සඳහන්වෙනවා නේ. එතකොට එතැන ඒ නැති කල්හි කියලා එන්නේ මොන අවස්ථාව ද? ඒ කියන්නේ දැන් සළායතන කියලා කියන්නේ විපාකයක් නම් එතැනින් සම්බන්ධකරගන්න ඕන කොහොම ද? ඒ එක්කම අර **කාමගුණ සූත්‍රයේ** ත්[8]විස්තරයක් එනවා නේ ස්වාමීන් වහන්ස, බුදුරජාණන් වහන්සේ දේශනාකරපු එකකට කියනවා මේ යමෙකුගේ ඇසත් නිරුද්ධ වේ ද, රූප සංඥා නැතිවේ ද, ඒ ආයතන දැනගන්නේ කෙසේ ද කියන විස්තරයේ දී ආනන්ද හාමුදුරුවෝ කියන්නේ සළායතන නිරෝධය යි කියලා යි. එතකොට එතැන ඒ සළායතන නිරෝධය යි කියන එකත් එක්ක පටිච්චසමුප්පාදය සම්බන්ධවෙන්නේ කොහොම ද ස්වාමීන් වහන්ස? (අද වෙලාව නැතිනම් ඉදිරි සතියක වුනත් කමක් නැහැ ස්වාමීන් වහන්ස.)

**පිළිතුර:**- ඒක ඉතින් ඇත්තට ම මේ හොඳ ප්‍රශ්නයක්, ගැඹුරු ප්‍රශ්නයක්. මේක ගොඩක් විස්තර කරගතයුතු කාරණාවක්. මම අදහස්කරගෙන හිටියා **මධුපිණ්ඩික සූත්‍රය**[9] ඉස්සරහට අරගෙන ඒකෙත් පටිච්චසමුප්පාදය ම යි සඳහන් වෙන්නේ. මේ මධුපිණ්ඩික සූත්‍රය යි ඊට පස්සේ **මහා තණ්හයසංඛය සූත්‍රයෙ**[10] යි, කියන මේ සූත්‍ර තුළ මේ පටිච්චසමුප්පාදය හොඳට ලිහිල්වෙන අවස්ථාවක්. ඉතින් ඒක නිසා මේ විපාක ටික තිබුණු පලියට කම් සකස්වෙන්නේ නැහැ. මේ ප්‍රපංච ඇතිවෙන වැඩ පිළිවෙළ මේක යි කියලා මධුපිණ්ඩික සූත්‍රයේ හොඳට දේශනා කරනවා. ඒක නිසා මම අර කලින් කල සූත්‍ර ගන්නවා වාගේ මේ මධුපිණ්ඩික සූත්‍රය යි මහා තණ්හයසංඛය සූත්‍රයයි වගේ මේ දෙවල් යම් දවසක ඉදිරියට අරගෙන කතා කරනවා. එතැන දී අපි විග්‍රහකරගමු.

---

[8]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (5 – 1) - 134වැනි පිටුව

[9]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) – 272වැනි පිටුව.

[10] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) – 602වැනි පිටුව.

එතකොට බුදුරජාණන් වහන්සේ එතැන මේ මධුපිණ්ඩික සූත්‍රයේ දී කෙටියෙන් විස්තරයක් කරන්නේ. ඉතින් සළායතන නිරෝධය කියලා යමක් පැනෙව්වා නම් අර කිව්වේ යම් සංඥාවක්, ලෝකයා දකින සංඥාවක් නැහැ. නමුත් සංඥාවකින් යුක්ත යි. එතකොට ඒ සංඥාව තුළ ඇහැ-කන-නාසය-දිව-ශරීරය කියන මේ ආයතන නැහැ. ඒ ආයතන නිරුද්ධවෙළා. ඒක නිබ්බාන සංඥාව. ඒක අරිහත් ඵල සිතක් සමග උපදින, එක්කෝ අරිහත් ඵල සමාපත්තිය තුළ ඇතිවන අවස්ථාවක්. මේ සළායතන හෝ දොළොස් ආයතන කියන ඔක්කෝම සංඛත ධර්මයන්. සංඛත ධර්මයන් කිසිවක්වත් අරමුණු නො වන තැනක් තමයි අපි මේ ඵල සමාපත්ති කියලා කියන දේවල්. එතකොට ඒ වාගේ සියල්ල ආයතන නිරෝධයට ගිහිල්ලා කියන එකෙන් අදහස් කරේ උන්වහන්සේට දැන් ඇස් නැහැ, කන නැහැ කියන එක නෙවෙයි. මේ ආයතන ක්‍රියාත්මක වෙලා කිසිදු චිත්ත චෛතසික ධර්මයක් උපදින්නේ නැහැ. ඒ නිසා තමයි එතැන සළායතන නිරෝධය යි කියලා කියන්නේ,උන්වහන්සේට ඇහැ දැන් නැහැ කියන එක.ඒක තේරුම්ගන්න ඕන. මොක ද අපි ඔය කතාව හොඳට අපි තේරුම්ගන්න ඕන අපි දන්නවා නිරෝධ සමාපත්තිය යි කියන එක. නිරෝධ සමාපත්තියට සමවැදුණු කෙනා, සංඥා වෙදයිත සියල්ල නිරුද්ධ යි. නිරෝධ සමාපත්තියට සමවැදිච්ච කෙන යි, මැරිච්ච කෙනාගෙ යි අතර වෙනස මොකක් ද කියලා අහන කොට කියනවා, මැරිච්චි කෙනාගෙත් ආශ්වාස ප්‍රාශ්වාස නිරුද්ධ යි. මැරිච්චි කෙනාගෙත් වෙදනා-සඤ්ඤා-සංඛාර නිරුද්ධ යි. මැරිච්චි කෙනා ගේ ඇහැ-කන-දිව-නාසය-ශරීරය කියන ඉන්ද්‍රිය ධර්ම සම්පූර්ණයෙන් නිරුද්ධ වෙලා තියෙන්නේ. නිරෝධ සමාපත්තියට සමවැදිච්චි කෙනාගෙත් ආශ්වාස-ප්‍රාශ්වාස නිරුද්ධ යි. ඒ වාගේ ම වේදනා-සඤ්ඤා-සංඛාර ආදී සියල්ල ම නිරුද්ධ යි. හැබැයි මේ පඤ්චඉන්ද්‍රියයෝ වෙසෙසින් ප්‍රසන්න වෙයි කියලා කියනවා. ඇහැ-කන-නාසය-දිව-ශරීරය කියන පඤ්චඉන්ද්‍රියයන් ඉතා දීප්තිමත්ව

පවතිනවා කියලා කියනවා. ඒක ඔය අපට නිරෝධ සමාපත්තිය ගැන කතාකරන කොට **වෙදල්ල සූත්‍රය**[11] වගේ සූත්‍රවල ඒවාගේ සඳහන්වෙනවා. තව කොතෙකුත් සූත්‍රවල තියෙනවා. මෙතැන මේ ***ඉන්‍ද්‍රියානි විප්පසන්නානි*** කියලා සඳහන්වෙනවා. ඉන්‍ද්‍රියයෝ වෙසෙසින් ප්‍රසන්න වේ. මොනවාද ඒ ඉන්‍ද්‍රියයන්? චක්ඛු ඉන්‍ද්‍රිය, සෝතඉන්‍ද්‍රිය, ඝාණඉන්‍ද්‍රිය, ජිව්හාඉන්‍ද්‍රිය, කායඉන්‍ද්‍රිය කියලා ඒ ඉන්‍ද්‍රිය ටිකත් පෙන්නනවා. එතකොට නිරෝධසමාපත්තියට සමවැදිච්චි කෙනා දැන් දොලොස් ආයතන ම නිරුද්ධකරලා. ආයතන විතරක් නෙවෙයි, ඒ උතුමන් වහන්සේට සඤ්ඤා වේදනාවත් ඇතුලේ තියෙනවා නෙවෙයි. සමාපත්ති බලයකින් නිරුද්ධකරළා තියෙනවා. හැබැයි නිරුද්ධකරා කියන එකෙන් අදහස් කරේ නිරෝධසමාපත්තියට සමවැදිච්චි කෙනාගේ ඇහැ-කන-නාසයත් නිරුද්ධවෙලා ද? නැහැ. ඒවා උපදින්නේ චිත්ත ප්‍රත්‍යයෙන් නෙවෙයි. ඇහැ උපදින්නේ කර්ම ප්‍රත්‍යයෙන්. ඇහැ උපදින ප්‍රත්‍යය එකක්. සිත් උපදින ප්‍රත්‍යය තව එකක්. හිත් උපදින්න ඇහැ උපකාර කරනවා. නමුත් ඒක වෙනම ධර්මතාවයක්. ඒ නිසා අපට රූප දැකීමවත්, ශබ්ද ඇහීමවත්, කියන දේ සිදුවුණත් නැතත් අපි නින්ද ගිහින් ඉන්නකොට අපට රූප පෙනුනේ නැහැ කියලා මේ ඇහැ කන වෙලා නෙවෙයි නේ, නිරුද්ධවෙලා නෙවෙයි නේ. ඒක කර්ම ශක්තියෙන් ඉපදෙමින් නැතිවෙමින්, ඉපදෙමින් නිරුද්ධවෙමින් පවතිනවා. මේකෙන් අදහස් කළේ ඇහැ තියෙනවා කියන මේ නිත්‍යභාවයට යන්න නෙවෙයි. කර්ම ප්‍රත්‍යය තමයි. ඒකට බලපාලා ඇතිවෙමින් නැතිවෙනමින් පවතිනවා ඒක. එතකොට ඒක වෙනම ප්‍රත්‍යතාවයක්. නිරෝධ සමාපත්තියට සමවැදිච්ච කෙනාගේ මේ ඉන්‍ද්‍රියයන් තියෙනවා. කර්ම ප්‍රත්‍යයෙන් ඒවා ඇතිවෙලා නැතිවෙලා පවතිනවා. හිත නිරුද්ධකරලා තියෙන නිසා චිත්ත ප්‍රත්‍යයෙන් උපදිනා ආශ්වාස-ප්‍රාශ්වාස ආදී සංඥා වේදනා

[11] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) 684වැනි පිටුව.

සියල්ල නිරුද්ධවෙනවා. ඒ නිසා අරක රූප ධර්මටික විතර යි. චක්ඛු ආදී ඉන්ද්‍රිය ධර්මයන් ටික තියෙනවා.

එතකොට දැන් ඒ නිරෝධසමාපත්තියට සමවැදිච්චි කෙනාගේ සළායතන නිරුද්ධ යි. දැන් එතැන සළායතන නිරුද්ධ යි කියලා කියන්නේ ආයතන දැන් නැහැ. විනාශවෙලා කියන එක නෙවෙයි. ආයතන අරමුණුවෙලා තමා තුළ චිත්ත චෛතසිකයන්, කුසල අකුසල ධර්මයන් උපදින්නේ නෑ කියන කාරණාව යි එතැන සළායතන නිරෝධය යි කියලා කියන්නේ. අනුපාදා පරිනිර්වානයෙන් ඒ ආයතන ටිකත් නිවීමට යනවා. ඒක වෙනම කාරණාවක්. නමුත් මේ ආයතන නිසා කුසල් අකුසල් උපදින්නේ කියන කාරණාව උන්වහන්සේ ක්‍ෂාත්කරළා තියෙනවා. ජීවත්ව ඉද්දීම රහත්වුණායින් පස්සේ උන්වහන්සේට සළායතන නිරෝධ යි. සළායතන නිරෝධයි කියන එක බොහෝ අය පටළවාගෙන තියෙනවා. ඇතැම් අය මාත් එක්ක ඔය සමහර ගිහි මහත්වරු කතා කරළා විග්‍රහ කරනවා දේශනා කරනවා මේ සළායතන නිරෝධය යි කියලා කියන්නේ උන්වහන්සේ රූප දැක්කාට ඇහැ නැහැ. මනසින් දකින්නේ කියලා එක එක විග්‍රහයන් කරනවා. ඇත්තට ම ඒක වරදවා තේරුම් ගැනීමක්. ඒ නිසා මම එතැන දී පැහැදිළිකරා: ඇහැ නිරුද්ධයි නම් මේ නිරෝධ සමාපත්තියට සමවැදිච්චි කෙනාටත් ඒ ඉන්ද්‍රියයන් තියෙනවා නම්, රහතන්වහන්සේ එදිනෙදා කටයුතු කරන කොට උන්වහන්සේ සළායතන නිරුද්ධකරළා තියෙන්නේ. හරි. නිරුද්ධකරළා කියන කාරණාවෙන් තේරුම්ගන්න ඕන අපි නැවත නූපදින ආකාරයට උන්වහන්සේගේ සිත සකස්වෙලා යි තියෙන්නේ. යම් අනුසයක් නිසා මේ ආයතන ටික හටගන්නවා නම් ඒ ආයතන ටික නිරුද්ධ කරාම අපට කියන්න වෙන්නේ, උන්වහන්සේ ආයතන ටික නිරුද්ධකරා කියලා යි. දැන් ඒක ම අනික් පැත්තට තියනවා නම්, දැන් අපට දැන් ඔළුවේ කැක්කුම නැතිවුණාට මම ඔළුවේ කැක්කුම නිරුද්ධ කරා කියලා කියන්න පුළුවන් ද? බැහැ. ඇයි?

අනාගතයේ දී ඔළුවේ කැක්කුම ඇතිවෙන්න පුළුවන් හේතු ටික තියෙන නිසා කවදා හරි ඔළුවේ කැක්කුම ඇතිවෙන්න පුළුවන්. මම දැන් ජරාවට පත් නො වුනා කියලා මම ජරාවෙන් යුක්ත යි. මම ජරාව නිරුද්ධකරළා නැහැ. ජරාව නිරුද්ධකරළා කියන වචනය කියන්න පුළුවන් කොතැන දී ද? දැන් මේ කය ජරාවට පත්වෙනවා කියන එක තුළින් නෙවෙයි. ජරාවට පත්වෙන්න නැවත නැවත හේතුවුන හේතු ධර්ම ටිකක් නැවත නූපදින ආකාරයෙන් නිරුද්ධකරළා නම් අන්න එතැන යි කියන්න සුදුසු ජරාව නිරුද්ධ කරළා, මරණය නිරුද්ධ කරලා. ජරා-මරණ නිරෝධ යි. ආයතන නිරෝධයි කියලා කියන්නේ අන්න ඒ නිසා යි. මේ ඇහැ නිසා අනාගතයේ නැවත නැවත ඇස් උපදින්න හේතු තියෙනවා නම් ඔහු ආයතන නිරුද්ධකරළා නැහැ. මේ ඇස් ඇතිවීමේ හේතුව මෙතැන ම නිරුද්ධකරළා නම්, ඒකර්ම ටික, අනාගතයේ ඇස් උපදින්න තියෙන හේතුව නැතිකරපු නිසා ඔහු සළායතන නිරුද්ධකරා කියලා මේ වාක්‍ය කියනවා. අන්න ඒ නිසා අපි ඒ විදියට තේරුම්ගන්න ඕන. මේක අපි ඉදිරියේ දී දීඝව කතාකරමු. තෙරුවන් සරණ යි.

----------

**ප්‍රශ්නයක්** :- ස්වාමීන් වහන්ස අර අනන්ත උපනිශ්‍රය කියන අවස්ථාවේ දී ඒ කියන්නේ ලොකු කුසලයක් කරන අවස්ථාවේ දී උදාහරණයක් හැටියට ඊට පස්සේ නිරන්තරයෙන් ම එහෙම නැතිනම් නිතැතින් ම තවත් කුසල් ගැන දැනෙනවා කියන අවස්ථාව ඔබ වහන්සේ තේරුම් කරා. ඒක සමහර වෙලාවට චිත්ත නියාම ධර්මයක් ද එහෙම නැතිනම් අර සාමාන්‍ය සෙවීමක් ද? අපි හිතමු දැන් විශාල ශබ්ද කිරිමක් අවස්ථාවක දී ඊට අදාලව සිදුවෙන (අපැහැදිළි යි.)පිපිරීමට පස්සේ එන ගින්දර වගේ, දුම් වගේ ඒ වාගේ අවස්ථාවක් ද ස්වාමීන් වහන්ස?

**පිළිතුර**:- ඔව් එතකොට එතැන ඇත්තට ම ධර්මතාවයක් ක්‍රියාත්මක වෙන්නේ, ප්‍රත්‍ය ශක්තියක් ක්‍රියාත්මක වෙන්නේ. එතකොට එතැන අපි අනන්තර උපනිශ්‍රය ගැන තමයි කතා කරේ. මුලින් හටගත්තු සිතක බලවත් ලෙස සිතක් ඉපදුනා නම් තව ඊළඟට අනතුරුව උපදින සිත්, එබඳු සිත් උපදින්න ප්‍රත්‍යවීමක් තියෙනවා. එතකොට ඒක අපි කියමුකෝ කෙනෙකුට බලවත් ලෙස ලෝභයක් ඉපදුණොත් ඒ ලෝභය නැවත නැවත උපදවන්න මේ මුලින් ඉපදිච්චි, බලවත් ලෙස ඉපදිච්චි ලෝභය හේතුවෙලා තියෙනවා. එතකොට මේ එතැන ධර්මතාවයක් හැටියට කියන්න බැහැ. ප්‍රත්‍ය ශක්තියක් ක්‍රියාත්මක වෙනවා. ඒක ධම්ම නියාමයක් නෙවෙයි. ධර්මතාවයක්. ලෝභය නමැති ධර්මය දැඩිව ඉපදුණොත් එතැන ධර්මතාවයක් ගොඩනැගෙනවා ඊළඟ අනතුරුව තව බොහෝ සිත් එබඳු සිත් උපදින්න පුළුවන් බවක් එතැන ගොඩනැගෙනවා. අන්න ඒකට තමයි එතැන අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා කිව්වේ. ඒ ප්‍රත්‍ය ශක්තියක් ගොඩනැගෙන්නේ. එහෙම ඒ විදියේ අරමුණක් මත බලවත් ලෙස ලෝභය නූපදිනවා නම් ඊළඟ ඊළඟ සිත් ඒක අරමුණු කරගෙන උපදින්නේ නැහැ. සමහරවිට අපි සමහර දේවල් දැක්කා. එතැනින් ඉවරයි. නැවත නැවත සිහිවෙන්නෙත් නැහැ. සිත් වැල් යන්නෙත් නැහැ. සමහර දේවල්වල සිහිවෙච්චි ගමන් ම අපි දන්නේ නැතුව අයෝනිසෝමනසිකාරය යෙදිලා බලවත්වුනහම, ඒක සමහරවිට අපි විදර්ශනා කරන වෙලාවේ දන්නේ ම නැතුව බොහෝ කාලයක් ඒ ඔස්සේ සිත් ගැවැසිලා. එහෙනම් ඒ ප්‍රත්‍ය ශක්තියක් තියෙන්නේ. ඒ ප්‍රත්‍ය ඇතිවුනොත් පමණයි. ඒ නිසා අනන්තර උපනිශ්‍රයභාවය කියන එක හැම සිතක, හැම වෙලාවෙ ම, ක්‍රියාත්මකවෙනවා නෙවෙයි. අනන්තර ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙන්න පුළුවන් හැම සිතකම. සිතක් ඉපදිලා, ඊළඟ සිත උපදින්න මුලින් ඉපදිච්ච සිත ප්‍රත්‍යවෙනවා. නමුත් මේ අනන්තර ප්‍රත්‍යය, අනන්තර උපනිශ්‍රය කියන එක හැම සිතක ම තියෙන්නේ නැහැ.

අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා කියන්නේ, සිතක් බලවත් ලෙස ඇතිවුණොත් තමයි ඒක උපකාරවෙනවා ඊළඟ සිත උපදින්න. ඒ ඒ ප්‍රත්‍යය වීමේ ශක්තිය එකක් චක්ඛු විඤ්ඤාණයට අනතුරුව සම්පටිච්ඡන සිත උපදිනවා කියන එකත් අනන්තර ප්‍රත්‍යයෙන් වෙන එකක්. හැබැයි අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයකින් නැහැ. ඒ නිසා මේ වාගේ මේක මම තව ටිකක් විග්‍රහකරන්නම් අපි ඊළඟ සැරේදි.

තෙරුවන් සරණයි.

# පිටකවරයේ ඇතුල්පැත්ත

එතකොට අකුසල කර්ම පථ ටික අපි කතාකරගත්තා. මේ අකුසල කර්ම පථ නො වෙන්න අනිවාර්යයෙන් බෞද්ධයෙක් වගබලාගත යුතු යි. විශේෂයෙන් නිවන් දකින කෙනා රැකිය යුත්තේ මෙන්න මේ අකුසල කර්ම පථ නො වෙන ආකාරයට යි. ඒ නිසා හැමෝට ම සාධාරණ විදියට අපි ශීලයක් පෙන්නුවා - පඤ්චශීලය කියලා. නමුත් ඇත්තට ම පඤ්චශීලය ප්‍රමාණවත් මදි ගිහිගේ කටයුතු කරන කෙනාට. එයාට ඇත්තට ම **ආජීවඅෂ්ඨමක ශීලයවත් නිත්‍ය ශීලය වශයෙන් සමාදන්වෙලා ඉන්න පුළුවන් වෙන්න ඕන.** ඒක පුළුවන් දෙයක්. ඒකේ විකාලභෝජනය කියන එක නැහැ. ඒකේ ජාත-රූප-රජත කියන මේ ශික්ෂාපදය නැහැ. ඒ නිසා කර්ම පථ බවට සකස්වෙන ශික්ෂා ටික එතැන පෙන්නනවා. ඒ නිසා මේ ඵරුෂවචනය, හිස් වචන කීම, කේලාම් කීම, මෙන්න මේවා ඒකාන්තයෙන් අකුසල කර්ම පථ යි. අන්න ඒ නිසා මේ ටික දැනගෙන, ඒ ටික අනිවාර්යයෙන් සකස් නොවන ආකාරයට, නිවන් දකින්න බණ භාවනා කරන හැම බෞද්ධයෙක් ම සීලය හැටියට සමාදන්වෙලා ජීවත්විය යුතු යි.